කාර්ය සාධන වාර්තාව 2018

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව


1. දැක්ම , මෙහෙවර , කාර්යයන් සහ වගකීම්
2. දෙපාර්තමේන්තුවේ ඒකක සහ අංශ
3. ආංශික කාර්යය සාධනය

3.1 සාර්ව ආර්ථික සංවර්ධනය

3.2 කෘෂිකර්ම , වාරිමාර්ග , ඉඩම් , පශුසම්පත් හා ධීවර

3.3 කර්මාන්ත, වෙළඳ ,කම්කරු, සංචාරක සහ විදුලිබල හා බලශක්ති

3.4 ප්‍රවාහන,මහාමාර්ග , වාරාය , ගුවන් සේවා

3.5 නාගරික සංවර්ධන , නිවාස , ජල හා පරිසර

3.6 සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය , ක්‍රීඩා හා සංස්කෘතික

3.7 අධ්‍යාපන උසස් අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන , තොරතුරු තාක්ෂණ , විද්‍යා හා තාක්ෂණ

3.8 ප්‍රාදේශිය සංවර්ධන හා සමාජ ආරක්ෂණ

3.9 රාජ්‍ය කළමනාකරණ හා පාලන

3.10 විමධ්‍යගත අයවැය

4. සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය
5. මානව සම්පත් සංවර්ධනය සහ සාමාන්‍ය පරිපාලනය
6. මුල්‍ය කාර්ය සාධනය

## 01.දැක්ම, මෙහෙවර හා ප්‍රධාන කාර්යයන්

**දැක්ම**

දැයේ සංවර්ධනයටඅවශ්‍ය උපදේශනය හා පහසුකම් සපයන්නා වීම

**මෙහෙවර**

ඉහල මට්ටමේ ක්‍රමසම්පාදන වෘත්තිකත්වයක් පවත්වා ගැනීම හා ක්‍රමසම්පාදන නිපුණතා යාවත්කාලීනව අන්තර්ජාතික මට්ටමට ගෙන ඒම හරහා සංවර්ධන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා වඩාත් සැලසුම් සහගත ප්‍රවේශයක් අනුගමනය කිරීම තුලින් රටේ සීමිත සම්පත් ප්‍රශස්ත අයුරින් යොදා ගැනීම

**ප්‍රධාන කාර්යයන්**

- ජාතික හා ආංශික ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා සහාය වීම.
- මධ්‍ය කාලීන ආයෝජන වැඩසටහන සකස් කිරීම:රාජ්‍ය ආයෝජන වැඩසටහන.
- ව්‍යාපෘති යෝජනාඇගයීම.
- අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සැපයීම.
- ආංශික ප්‍රවේශය ගොඩනැංවීම සඳහා මූලිකත්වය ගැනීම
- ව්‍යාපෘතිපෙළගැස්ම.
- සැලසුම් මාර්ගෝපදේශ සැකසීම.
- උප ජාතික මට්ටමේ සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ සැපසීම.
- විමධ්‍යගත මූලධන අයවැය ප්‍රතිපාදන කලමණාකරණය සඳහා තාක්ෂණික සහාය ලබා දීම.
- සංවර්ධන පාර්ශවකරුවන්ගේ දූත මෙහෙයන් කළමණාකරණය කිරීම.
- විශේෂ පැවරුම් සම්පූර්ණ කිරීම
- කාර්යමණ්ඩල ධාරිතා සංවර්ධනය
- පොදු පරිපාලනය

## 02.දෙපාර්තමේන්තුවේ ඒකක හා අංශ

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කාර්යක්ෂමව ඉටුකරලිම පිණිස දෙපාර්තමේන්තුව අංශ 10 කට වෙන් කර ඇත. එම අංශ 10 තවදුරටත් ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රය තුළ විවිධ අංශ නියෝජනය වන පරිදි උප අංශ 26 කට වෙන් කර ඇත. එක් එක් අංශ ඒවා නියෝජනය කරන ක්ෂේත්‍රයට අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් සිදු කරනු ලබන ඒ ඒ අංශයේ ප්‍රතිපත්ති සැලසුම් නිර්මාණය හා අදාළ අනෙකුත් සංවර්ධන කටයුතු සියල්ල කෙරෙහි වගකීම දරණු ලබයි.

මීට අමතරව දෙපාර්තමේන්තුවේ කාර්යයන් පවත්වාගෙන යාම සඳහා පහත අංශ 3 ද ඇත.

1. සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය
2. පරිපාලන අංශය
3. මූල්‍ය අංශය

**දෙපාර්තමේන්තුවේ අංශ**

- සාර්ව ආර්ථික සංවර්ධනය.
- කෘෂිකර්ම , වාරිමාර්ග , ඉඩම් , පශුසම්පත් හා ධීවර
- කර්මාන්ත,වෙළද,විදුලිබලහාබලශක්ති
- ප්‍රවාහන, මහාමාර්ග , වරාය හා ගුවන් සේවා
- නාගරික සංවර්ධන , නිවාස, ජල හා පරිසර
- සෞඛ්‍ය හා දේශිය වෛද්‍ය , ක්‍රීඩා හා සංස්කෘතික
- අධ්‍යාපන උසස් අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන , තොරතුරුතාක්ෂණ , විද්‍යා හා තාක්ෂණ
- ප්‍රාදේශීය සංවර්ධන හා සමාජ ආරක්ෂණ
- රාජ්‍ය කළමනාකරණය හා පාලන
- විමධ්‍යගත

**03. ආංශිකකාර්යසාධනය**

**3.1සාර්ව ආර්ථික අංශය**

සාර්ව ආර්ථික අංශයේ අරමුණ වන්නේ ජාතික සංවර්ධනප්‍රමුඛතා හා ප්‍රතිපත්ති, ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති බවට පරිවර්තනය කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශ වලට අවශ්‍ය සහය ලබා දීම වේ. තවද, ජාතික හා ජාත්‍යන්තර තත්වයන් විශ්ලේෂණය කරමින් අනෙකුත් අංශ වලට ආංශීය උපාය මාර්ග සැදීමට හා ආංශීය සැලසුම් සමාලෝචනය කිරීමට අවශ්‍ය යෙදවුම් ලබා දෙයි.

ප්‍රගතිය

- රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020 යාවත්කාලීන කිරීමේ මූලික කටයුතු සම්පූර්ණ කිරීම.
- මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2017 වාර්ෂික වාර්තාවේ අඩංගු දැක්ම 2025 හා රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020 ප්‍රගතියයන පරිච්ඡේදය සකස් කරන ලදි.
- 2017 මහ බැංකු වාර්තාව සැදීමට අවශ්‍යරාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020ප්‍රගතියට අදාල තොරතුරු එක්රැස් කිරීම හා ලබා දීම.
- ප්‍රාග්ධන අයවැය සීමා (2019-2021) අංශ අනුව හා අමාත්‍යාංශ වශයෙන් සැකසීම හා පූරෝකතනය කිරීම.
- ව්‍යාපෘති යෝජනා සඳහා ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතිය යාවත්කාලීන කිරීම සඳහා අදහස් හා යෝජනා ලබා ගැනීමට අදාල අමාත්‍යාංශ හා අනෙකුත් ආයතන වලට වැඩමුළු 3ක් සංවිධානය කිරීම.
- ඒ අනුව ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතිය යාවත්කාලීන කිරීම.

**3.2 කෘෂිකර්ම, වැව්ලි , වාරිමාර්ග, ඉඩම්, පශුසම්පත් හා ධීවර අංශ**

**කෘෂිකාර්මික අංශය**

රටේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂි අංශය කැපීපෙනෙනදායකත්වයක් දක්වනු ලබන අතර, මෙහිදී ශ්‍රම බලකායේ දක්වන දායකත්වය හා අනෙකුත් ආර්ථික අංශයන්හි සංවර්ධනය සඳහාදක්වන සම්පත් දායකත්වය විශේෂ වේ.ප්‍රතිපත්තිමය වශයෙන් වර්තමානයේදී කෘෂි අංශය නවීකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇති අතර මෙහිදී ඉහළ ඵදායීතාවයක් ලබා ගත හැකි මෙන්ම නවීන තාක්ෂණය භාවිතා කරමින් තිරසාර කෘෂිකර්මාන්තයක් කෙරෙහි යොමු වීමට ප්‍රධාන අවධානය යොමු වී ඇත.

මෙහිදී ජාතික ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම මෙන්ම ජාත්‍යන්තර වෙළඳපොළ තුළ තරඟකාරීත්වය වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු වී ඇත. ඒ අනුව කෘෂි කාර්මික අංශය සඳහා ආයෝජනය කරන ලද ප්‍රතිපාදන කෘෂි කාර්මික අංශයේ ප්‍රධාන අංගයන් ප්‍රවර්ධනය මඟින් ප්‍රතිදාම ශක්තිමත් කිරීම, නිර්ණායක ප්‍රවර්ධනය මඟින් කෘෂි කාර්මික අංශයේ ප්‍රමිති වර්ධනය හා ප්‍රවර්ධනය (Good Agriculture practices ), නවෝත්පාදක හා ඵලදායී තාක්ෂණ සහ වෙළඳපොළ ඒකාබද්ධ කිරීමත් සමඟ සාධක ඵලදායීතාවය වැඩි දියුණු කිරීම ආදිය සඳහා යොදා ගෙන ඇත.එසේම දේශගුණික විචල්‍යතාවයන් නියඟය , ගංවතුර ආදීය සැලකිල්ලට ගනිමින් කෘෂි කාර්මික අංශය සංවර්ධනය කෙරෙහි ද වැඩි අවධානයක් ලබා දී ඇත.

**බෝග කෘෂිකර්මය**

බෝග කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩිදියුණු කිරීම හා ශක්තිමත් කිරීම සඳහා රජය 2018 වර්ශයේ දී ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කර ක්‍රියාත්මක කර ඇත. රජයේ ආයෝජන ප්‍රධාන වශයෙන් නිෂ්පාදනය වැඩිදියුණු කිරීම හා අපනයනය තුළින් ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම කෙරෙහි යොමු කර ඇත. ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන 2018 දී පවා සහල් නිෂ්පාදනය, ඵලදායිතාවය වැඩිදියුණු කිරීම සහ වෙනත් ක්ෂේත්‍ර බෝග; බඩඉරිඟු , මිරිස් , ලූනු , මුං ඇට , කව්පි , ආදියෙහි නිෂ්පාදන ඵලදායීතාවය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කිරීම සිදු විය. මීට අමතරව අපනයන නිෂ්පාදන වෙළඳපොළ ඉලක්කර ගනිමින් පළතුරු හා කුළුබඩු නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා විශාල පරිමාණ බෝග නිෂ්පාදන කලාපයන් ඇති කිරීම ද සිදු කරන ලදී.එසේම ජාත්‍යන්තර වෙළඳපොළ ඉලක්ක කර සහ දේශිය පරිභෝගිකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා කෘෂිකාර්මික නිෂ්පාදන වල ගුණාත්මක ප්‍රමිතින් වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් ආරම්භ කරන ලදී . එහිදී යහපත් කෘෂිකාර්මක සැලැස්ම සකස් කිරීම මඟින් පරිභෝජනය සඳහා සෞඛ්‍ය සම්පන්න ආහාර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා පියවර ගෙන ඇත. අපනයන කෘෂිකර්මාන්ත සඳහා ක්ෂේත්‍රයේ පවතින බාධාවන් ඉවත් කිරීම කෙරෙහි රජයේ ප්‍රධාන අවධානය යොමු වී ඇත. ඒ අනුව 2018 වර්ෂයේදී බෝග කෘෂිකර්මය සංවර්ධනය සඳහා රු බිලියන 12 ක් ආසන්න වශයෙන් ප්‍රාග්ධන ආයෝජන ලෙස වෙන් කර ඇත.

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මඟින් අවසන් කරන ලද ක්‍රියාකාරකම්**

- ව්‍යාපෘති යෝජනා 17ක් ඇගයීමට ලක්කර නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමුකිරීම.
- කෘෂිකාර්මික අමාත්‍යාංශය සහ ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 11 ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම

**විශේෂ වැඩසටහන්**

- වී ගබඩා කිරීම අධීක්ෂණය සඳහා කළමණාකරණ තොරතුරු පද්ධතියක් සකස් කිරීම. මෙමගින් කිසියම් කාලයකදී රට තුළ වී/සහල් තොග තත්වය පිළිබඳව සොයා බැලීම සිදු කළ හැකි අතරඑම තොරතුරු පද්ධතිය කෘෂි කර්ම දෙපාර්තමේන්තුවේ " Crop Look Net" තොරතුරු පද්ධතියේ සමඟ ඒකාබද්ධ කිරීමට පසුව තීරණය කරන ලදී.

- කෘෂි කර්ම ක්ෂේත්‍රයට අයත් අංශ සියල්ලටම අදාළව කෘෂි කර්ම ප්‍රතිපත්තිය සකස් කිරීමට සියලු පාර්ශව වකරුවන් සමඟ එක්ව කටයුතු කිරීම හා අවශ්‍ය තාක්ෂණික යෙදවුම් සහ ප්‍රතිපත්තිමය මගපෙන්වීම ලබාදීම.

- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන "UNDP" සහ ආහාර හා කෘෂි කර්ම සංවිධානය "FAO" සහාය ඇතිව අදාළ රේඛීය අමාත්‍යාංශ හා ආයතන සමඟ එක්ව කෘෂි කර්ම කේෂ්ත්‍රයට අදාළ තිරසාර සංවර්ධන අරමුණු දේශීයකරණය කිරීම පිළිබඳව අධ්‍යනයක් සිදු කිරීම.

**වැවිලි ක්ෂේත්‍රය**

වැවිලි අංශය විදේශ විනිමය ඉපැයීම් අනුව ආර්ථිකයේ දෙවන විශාලතම දායකයා වන අතර එම අංශය තව දුරටත් පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම මගින් රටේ ආර්ථිකය සඳහා දක්වන දායකත්වය වැඩි කල හැක .වැවිලි අංශය ප්‍රධානවශයෙන් තේ, රබර් සහ පොල් යන බෝග වලින් සමන්විත වන අතර දළ දේශීය නිෂ්පාදිතයට එහි දායකත්වය 2% කි .ඒසේම දැනට වැවිලි භෝග හෙක්ටයාර් මිලියන 0.9 ක් වගා කර ඇත.ආනයන ආදේශක ලෙස කටුපොල්, සීනී සහ කජු වගාව ද දළ දේශීය නිෂ්පාදනය සඳහා සැලකිය යුතු දායකත්වයක් දරයි. ජනගහනයෙන් ආසන්න වශයෙන් මිලියන 1 ක්පමණ වැවිලි කර්මාන්තය ආශ්‍රිතව ජීවත්වන අතර, මිලියන 1.5 කට අධික ජනගහනයක් සඳහා ඍජු හෝ වක්‍රව රැකියා අවස්ථා සපයා ඇත.දැනට වැවිලි කර්මාන්තය ආශ්‍රිතව පැන නැගී ඇති ගැටළු වන නිෂ්පාදන ඵලදායිතාවය අඩු වීම , නිෂ්පාදන විවිධාංගීකරණ හිඟය, ශ්‍රම හිඟය, සාම්ප්‍රදායික වෙළෙඳපොළ මත යැපීම මෙන්ම තාක්ෂණික බාධාවන් මෙම අංශයේ ක්‍රියාකාරිත්වයට බාධා ඇති කර ඇත. මෙම පසුබිම තුළ ඵලදායිතාවය හා විවිධාංගීකරණය වැඩිදියුණු කිරීම මඟින් වැවිලි අංශයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම රජයේ ප්‍රධාන අරමුණු කරගෙන ඇත.

මීට අමතරව, වතු කර්මාන්තය ආශ්‍රිතව ජීවත් වන ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම රජයේ ප්‍රධාන අරමුණක් වන අතර එම ජනතාව සඳහා දැනට ජීවත් වන රේඛීය කාමර වෙනුවට ඉඩම් කැබැල්ලක් සහිත යහපත් නිවාස ලබා දීම සඳහා ආයෝජන සිදු කරමින් පවති .ඒ අනුව , 2018 වර්ශයේදී, රු. බිලියන 8.2 ක ප්‍රතිපාදන රජය විසින් වෙන් කර ඇති අතර එමගින් රු .බිලියන 1.2 ක ප්‍රාග්ධන වියදමක් සහිත විශාල ව්‍යාපෘති සඳහා ආයෝජන වෙන් කර ඇත .

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ වැවිලි අංශය මඟින් සම්පූර්ණ කරන ලද කාර්යයන්**

- ව්‍යාපෘතියෝජනා13 ඇගයීමට ලක්කර අදාල නිර්දේශ ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.
- වැවිලි ක්ෂේත්‍රයට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශ 03ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

**විශේෂ වැඩසටහන්**

- රාජ්‍ය ආයෝජන වැඩසටහන (2018-2021) සඳහා වැවිලි අංශය පිළිබද වාර්තාවක් සකස් කිරීම

- භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගේ උපදෙස්මත රබර් හා තේ කර්මාන්තය සඳහා ලබාදුන් සහනාධාර පිළිබඳ සමාලෝචනයක් සිදුකිරීම හා එම විශ්ලේෂණය පිළිබඳ උපායමාර්ග පත්‍රිකාවක් අමාත්‍ය මණ්ඩලයේ අනුකාරක සභාවට ඉදිරිපත්කිරීම සඳහා සකස් කිරීම.

**ධීවර අංශය**

ධීවරකර්මාන්තයරටේ අර්ථික සංවර්ධනය නඟා සිටුවීම සඳහා විශාල දායකත්වයක් ලබා දිය හැකි ප්‍රමුඛතම අංශයක් ලෙස හඳුනාගෙන ඇති අතර මිලියන 2.6 ක පමණ ජනතාවගේ ජීවනෝපායන් සැපයීම හා ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සම්බන්ධයෙන් වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි.

2018 වසරේදී මෙරට මුළු මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 527,060 ක් වන අතර, කරදිය ධීවර කර්මාන්තය 84% ක දායකත්වයක් ලබා දී ඇත. එසේම මිරිදිය ධීවර කර්මාන්තය හා ජලජ ජීවී වගාව පිළිවෙළින් 14% හා 2% ක කොටසක් හිමි කර ගෙන ඇත. එසේම, මෙරට ජනතාවගේ වාර්ෂික ප්‍රෝටීන අවශ්‍යතාවයෙන් අඩක් මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වලින් සපුරා ගන්නා බවට ඇස්තමේන්තු කර තිබේ. වර්තමානයේ ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය වසරකට 17Kg ලෙස ගණනය කර ඇති අතර ඉදිරි වසර කිහිපය තුළදී එය 22kg දක්වා ඉහළ දැමීමට ඉලක්ක කර ඇත.

2018 වර්ෂයේදී ධීවර කර්මාන්තය සඳහා වන රාජ්‍ය ආයෝජනය මූලික වශයෙන් වරාය, නැංගුරම්පලවල් හා තොටුපලවල් සංවර්ධනය හා නවීන තාක්ෂණය හඳුන්වාදීම, මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන සංවර්ධනය, ධීවර ප්‍රජාව සවිබල ගැන්වීම හා ධීවර යටිතල පහසුකම් සංවර්ධනය කිරීම පිළිබඳ අවධානය යොමු කර ඇත.මීට අමතරව ධීවර ප්‍රජාව ඉලක්ක කර ගනිමින් සුභ සාධන වැඩසටහන් කිහිපයක් ද 2018 දී ක්‍රියාත්මක කර ඇත.

**ධීවර කර්මාන්තයේ සංවර්ධන සඳහා ඉටු කරන ලද කාර්යයන්**

- ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා 20ක් ඇගයීමට ලක් කර අරමුදල් ලබා ගැනීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.
- ධීවරහාජලජසම්පත්සංවර්ධනඅමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 3ක් සඳහා නිරීක්ෂණ ලබා දීම.

**විශේෂ ක්‍රියාකාරකම්**

- තිරසාර සංවර්ධන ඉලක්ක වල ඇතුලත් (Goal - 14)“තිරසාර සංවර්ධනය සඳහා සාගර, මුහුදු හා සමුද්‍රීය සම්පත් සංරක්ෂණය හා තිරසාර භාවිතය” ආදාළව හඳුනාගන්නා ලද උපායමාර්ග, ජාතික දර්ශක සහ ඉලක්ක සඳහා වැඩසටහන් සහ මූල්‍ය ප්‍රතිපාදන ඇතුළත් වාර්තාවක් සකස් කිරීම.
- කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ(CARP) ජලජ සම්පත් පිළිබඳව ජාතික සමුළුවට සහභාගීවීම.
- CARP යටතේ ජලජ සම්පත් පිළිබඳව ජාතික කමිටුව විසින් සංවිධානය කරන ලද“ගෝලීය ජලජීවි නැඹුරුතා” පිළිබඳ වැඩමුළුවට සහභාගී වීම හා අවශ්‍ය තාක්ෂණික යෙදවුම් ලබා දීම.
- ධීවර අංශය හා සම්බන්ධ අදාල රාජ්‍ය ආයතන සම්බන්ධ කරගනිමින් තිරසාරසංවර්ධන ඉලක්ක කෘෂිකාර්මික අංශයට අදාලව දේශියකරණයකිරීම පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කිරීම

- ධීවර හා ජලජ සම්පත් ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා වැඩමුළුවලට සහභාගී වීම හා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීම.
- 2019 - 2021 මධ්‍යකාලීන අයවැය රාමුව සඳහා ධීවර අංශයට ආදාළව ව්‍යාපෘති පෙලගැස්ම යාවත්කාලීන කිරීම.
- දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල ප්‍රගති සමාලෝචන රැස්වීම්වලට සහභාගීවීම.

**පශු සම්පත් අංශය**

පශු සම්පත් අංශය දළ දේශීය නිෂ්පාදිතයට 0.8% ක පමණ දායකත්වයක් සපයන අතරම, විශේෂයෙන් ග්‍රාමීය ජීවනෝපායන්ගෙන් 20% ක පමණ දායකත්වයක් ලබා දෙමින්රටේ ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව තහවුරු කිරීමසඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.මෙම අංශයට ප්‍රධාන වශයෙන්ම කිරිගව, කුකුළු, ඌරු, එළු හා බැටළු උප අංශ ඇතුලත් වේ.

කිරිගව අංශය පශු සම්පත් ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම අංශයක් වන අතර 2020 දී කිරි නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත වීම ඉලක්ක කර ඇත. ඒ අනුව, කිරි ගවයින් ආනයනය, කිරි සැකසුම් කර්මාන්ත ශාලා නවීකරණය, පශු වෛද්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම, පර්යේෂණ සහ ධාරිතා වර්ධනය කිරීම කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත.මීට අමතරව, පශු සම්පත් නිෂ්පාදන විශේෂයෙන් කුකුළු මස්, බිත්තර සාධාරණ මිලකට ලබා දීම රජයේ ප්‍රමුඛ ප්‍රතිපත්තියක් වේ.

වර්තමානයේදී පශු සම්පත් නිෂ්පාදන දේශීය ඉල්ලුම සඳහා පමණක් නොව විදේශීය වෙළඳපොළ සඳහා ද යොමු කිරීමේ හැකියාවක් පවතී.එබැවින් පශු සම්පත් අංශයේ සංවර්ධන ප්‍රතිපත්ති දේශීය සත්ත්ව නිෂ්පාදන ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වැඩි කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. ඒ අනුව, නවීන තාක්ෂණික ක්‍රම ගොවිපළ කළමනාකරණය සඳහා යෙදවීම, ගොවිපළ මෙහෙයුම් සඳහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය දිරි ගැන්වීම සහ සම්ප්‍රදායික භාවිතාවයන් ව්‍යාප්ත කිරීම හරහා රැකියා අවස්ථා ඇති කිරීම පිළිබඳව ප්‍රමුඛතාවයක් ලබා දී ඇත.

**ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ පශු සම්පත් අංශය මඟින් සිදු කරන ලද කාර්යයන්**

- ව්‍යාපෘති යෝජනා 4ක් ඇගයීම සහ අවශ්‍ය අරමුදල් ලබා ගැනීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවට හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.
- පශු සම්පත් අංශයේ සංවර්ධනය සඳහා අදාල අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 3කට නිරීක්ෂණ ලබා දීම.

**විශේෂ ක්‍රියාකාරකම්**

- 2019 - 2021 මධ්‍ය කාලීන අයවැය රාමුව සඳහා පශු සම්පත් අංශයට ආදාළව ව්‍යාපෘති පෙලගැස්ම යාවත්කාලීන කිරීම.
- කිරිගව ආනයනය කිරීම පිළිබඳ ව්‍යාපෘතියේ මෙහෙයුම් කමිටු වලට සහභාගී වීම.
- ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ (CARP) පශු සම්පත් හා කුකුළු කර්මාන්තය පිළිබඳව ජාතික සමුළුවට සහභාගී වීම.

- "පශු සම්පත් අංශයට අදාල රාජ්‍ය ආයතන සම්බන්ධ කර ගනිමින් තිරසාර සංවර්ධන ඉලක්ක කෘෂිකාර්මික අංශයට අදාලව දේශියකරණය කිරීම" පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කිරීම.
- දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති වල ප්‍රගති සමාලෝචන රැස්වීම් වලට සහභාගී වීම.

**වාරිමාර්ග හා ඉඩම්**

2018 වර්ෂයේ වාරිමාර්ග අංශය සඳහා රජයේ සමස්ත වියදම රු. බිලියන 68.92 ක් වූ අතර එම මුදලින් රු. බිලියන 61.94 ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් වැය කරන ලදි. ජල සම්පත් සංවර්ධනය යටතේ දැනටමත් ආරම්භ කොට ඇති මහවැලි ජල සුරක්ෂිතතා ආයොජන වැඩසටහන, යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය, කළුගඟ ජලාශ සංවර්ධන ව්‍යාපෘතිය, උමාඔය ජල හැරවුම් ව්‍යාපෘතිය, දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය, වේලි ආරක්ෂණ හා ජලසම්පත් සැලසුම් කරන ව්‍යාපෘතිය වැනි මහා පරිමාණ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී. ඒ අතරම වාරි ප්‍රතිසංස්කරණව්‍යාපෘති රැසක් මගින් කෘෂිකාර්මික හා වෙනත් ජල අවශ්‍යතාවයන් සඳහා ජලය සැපයීම සඳහා ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛත්වය ලබා දී ඇත.
2018 දී ඉඩම් අංශයෙහි සමස්ත වියදම රු. මිලියන 9,158ක් වන අතර එයින් රු. මිලියන 3,235ක් ප්‍රාග්ධන වියදම් වේ. 2018 දී ඉඩම් හිමිකම් වැඩ සටහන (බිම්සවිය) සඳහා සැලකිය යුතු මුදලක් වැය කර ඇත.2018 දී රාජ්‍ය සංවර්ධන වැඩසටහන් සඳහා ඉඩම් හඳුනාගෙන අත්පත් කිරීම සිදු කර ඇත.

**වාරි අංශයට අයත් විශේෂ වැඩසටහන්**

- රාජ්‍ය ප්‍රාග්ධන ආයෝජනය විශ්ලේෂණය කිරීම සඳහා දැනට ක්‍රියාත්මක හා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රධාන ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති හා ප්‍රමුඛ ව්‍යාපෘති සිතියම් ගත කිරීම.
- කුඩා වැව් හා අමුණු පුනරුත්ථාපනය කිරීමේ දී සිදුවන ප්‍රසම්පාදන ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම.
- ගංවතුර අවම කිරීම , ආපදා වැලැක්වීම සහ ජල සම්පත් සංවර්ධනය ට අදාළව 2019-2024 කාල පරිච්ඡේද දය තුළ සිදු කිරීමට නියමිත ව්‍යාපෘති ඇතුළත් ප්‍රමුඛතා ලේඛණයක් සකස් කිරීම.
- වාරිමාර්ග සහ ජලසම්පත් අමාත්‍යාංශයේ ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා ව්‍යාපෘති සැලසුම්කරණ ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් අවසන් කරන ලද වාරි අංශයට අයත් කාර්යයන්**

- වාරි අංශයේ ව්‍යාපෘති වාර්තා 10 හා ඉඩම් අංශයේ ව්‍යාපෘති වාර්තා 01 ඇගයීමට ලක් කොට, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ විදේශ සම්පත් හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවලට ඉදිරි කටයුතු සඳහා යොමු කිරීම.
- වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සහ ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 16 කට අදාළ නිරීක්ෂණ සකස් කිරීම.

- මොරකහකන්ද සහ කළුගඟ ජලාශ සංවර්ධන ව්‍යාපෘතිය, යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය, මහවැලි ජල සුරක්ෂණ ආයෝජන වැඩසටහන, යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය හා තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය සහ අනෙකුත් සංවර්ධන ව්‍යාපෘතිවල මෙහෙයුම් කමිටු රැස්වීම්වලට සක්‍රියව දායකවීම.
- දැනට ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගති සහ ප්‍රතිපත්ති සමාලොචන රැස්වීම්වලට සක්‍රියව දායකවීම.
- වාරිමාර්ග හා ඉඩම් අංශයට අදාල තොරතුරු සපයමින් රාජ්‍ය ආයෝජන සැලැස්ම (2017-2020) යාවත්කාලීන කිරීමට සහාය වීම.
- රේඛීය අමාත්‍යාංශ, අදාල පාර්ශවකරුවන් සහ ලෝක බැංකුව සමඟ ඒකාබද්ධ ජලාධාර සහ ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්මෙහි කෙටුම්පත සකස් කිරීමට අදාල තාක්ෂණික සහයෝගය සැපයීම.

### 3.3 කර්මාන්ත, වෙළඳ හා කම්කරු, සංචාරක සහ විදුලිබල හා බලශක්ති

ආර්ථික සංවර්ධනයේ ඉලක්කගත බලවේග ලෙස කර්මාන්ත, වෙළඳ හා ආයෝජන අංශ ප්‍රධාන කාර්යයක් සිදු කරයි. එමනිසා,ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව කර්මාන්ත, සුළුහා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ රාජ්‍ය ව්‍යාපාර, ජාත්‍යන්තර වෙළඳාම හා විදේශ සෘජු ආයෝජන හරහා ඉහත අංශ ශක්තිමත් කිරීමට අවශ්‍යප්‍රතිපත්ති යෙදවුම් ලබා දේ. එසේම, ව්‍යාපෘති යෝජනා ඇගයුම් කටයුතුවලට සම්බන්ධ වෙමින් ආංශික මූල්‍යනය කටයුතු සඳහා දායක වේ. රටේ අවශ්‍යතාවයන් හඳුනාගනිමින්, 2018 වර්ෂය තුලදී පහත කාර්යයන් සිදු කරන ලදී.

- ව්‍යාපෘති යෝජනා 150ක් ඇගයීමට ලක් කරන ලද අතර අදාළ නිර්දේශ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා අදාළ රේඛීය ආයතන වෙත ලබා දෙන ලදී.
- රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරනලද අමාත්‍යමණ්ඩල සංදේශ 05ක් සඳහා නිරීක්ෂණ ලබාදෙන ලදී.
- 2018 - 2021 කාල රාමුව සඳහා රාජ්‍ය ආයෝජන වැඩසටහන යාවත්කාලින කිරීම සඳහා කර්මාන්ත, වෙළඳ හා කම්කරු ක්ෂේත්‍රවලට අදාළ තොරතුරු ලබාදෙමින් සහය වීම.
- Colombo - TrincomaleeEconomic Corridor Development" මැයෙන් අධ්‍යයනයක් සිදුකිරීම සඳහා තාක්ෂණික සහය ලබා දීම හා එහි අවසන් වාර්තාව පිළිබඳ දැනුවත් කිරීම සඳහා සියළු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන්, ආසියානු සංවර්ධන බැංකුව හා ඒකාබද්ධව, උසස් මට්ටමේ නිළධාරීන් සඳහා වැඩමුළුවක් පැවැත්වීම .
- "2025 දැක්ම" ක්‍රියාත්මක කිරීම සඳහාආංශික ප්‍රතිපත්තිමය යෙදවුම් ලබාදීම.
- ජාතික අපනයන ක්‍රමෝපාය(National Export Strategy) සඳහා ප්‍රතිපත්තිමය යෙදවුම් (Policy Input) ලබා දීම.

- තිරසාර සංවර්ධන අභිමාතාර්ථ 2030 වැඩසටහන සඳහා ආංශික යෙදවුම් (Sectorial Input) ලබා දීම.

**රැකී රක්ෂා සහ විදේශ රැකියා**

රැකී රක්ෂා සහ විදේශ රැකියා ප්‍රතිපත්ති තුළින් ආර්ථිකසංවර්ධනය සාක්ෂාත් කරගැනීම සඳහා අත්‍යාවශ්‍ය වන දේශීයව හා විදේශවල සේවය කරන සේවකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ප්රවර්ධනය කිරීමටත් රටේ ආර්ථිකය සංවර්ධනයට අත්‍යාවශ්‍ය වන කර්මික අංශයේ සබඳතා ශක්තිමත් කිරීමත් අපේක්ෂිතය. ඒ අනුව, දැනට පවත්නා නීති රීති බලාත්මක කිරීම හා ඉදිරියේදී සිදු විය යුතු ප්‍රතිසංසකරණ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සමගාමීව සිදු කිරීමටත් අවශ්‍ය වේ. එම අවශ්‍යතාවයන් හඳුනාගනිමින්, 2018 වර්ෂය තුලදී පහත කාර්යයන් සිදු කරන ලදී.

- ව්‍යාපෘති යෝජනා 10 ක් ඇගයීම හා අවශ්‍ය නිර්දේශ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා අදාළ රේඛීය ආයතන වෙත ලබා දෙන ලදී.

**සංචාරක අංශය**

සංචාරක අංශය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම කර්මාන්තයක් ලෙස පිළිගෙන ඇති අතර එය ආර්ථිකයට ප්‍රධාන විදේශ විනිමය ඉපැයීමේ මාර්ගයක් ලෙස 2017 වර්ෂයේදී සංචාරක පැමිණීම මිලියන 2.1ක් සමඟ ඇමරිකානු ඩොලර් මිලියන 3,925ක් දායක කර තිබේ. සංචාරක දැක්ම 2025 ට පහසුකම් සැපයීමට සහ එක්සත් ජාතීන්ගේ සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ ලගාකර ගැනීමට සහය වීම සඳහා නව සංචාරක උපායමාර්ගික සැලැස්ම (TSP) 2017 - 2018 හඳුන්වා දෙන ලදී.

ශ්‍රී ලංකාවේ ස්වාභාවික හා සංස්කෘතික උරුමයන් පිලිබිඹු කරමින් ඉහළ වටිනාකමකින් යුත් සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ස්ථාපිත කිරීම ඉලක්ක කර ඇති නව සංචාරක උපාය මාර්ගික සැලැස්ම අනුව සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමට රජය සැලසුම් කරයි. සංචාරක කර්මාන්තය සමාජයිය වශයෙන් පරිපූර්ණ හා පරිසර හිතකාමී ලෙස නිර්මාණය කරමින් නව වෙළඳපොල වලින් සංචාරක ආකර්ශනය සඳහා පෞද්ගලික අංශය දිරිමත් කිරීම සහ දේශිය හා විදේශීය සංචාරකයින් අතර ඉහල ඉල්ලුමක් ඇති නව නිෂ්පාදන පිරිනැමීමට ද කටයුතු කරයි. තවද සංචාරක ආකර්ශනය මෙන්ම සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රාජ්‍ය ප්‍රතිපත්තිවල පෞද්ගලික අංශය සමග PPP ව්‍යාපෘති කෙරෙහි වැඩි අවධානය යොමු කරනු ඇත. රට තුල විවිධ ස්ථානවල ජනප්‍රිය සංචාරක ආකර්ශනය ලබාගත හැකි ව්‍යාපෘති ලෙස දැදුරුඔය සංචාරක පරිසර කලාපයසහ සංස්කෘතික ත්‍රිකෝණය ආශ්‍රිත සංචාරක ව්‍යාපෘතිය, කොළඹ කොටුව තුල උරුම ගොඩනැගිලි ව්‍යාපෘතිය, ගාල්ල හා මාතර සංචාරක ව්‍යාපෘති, කොග්ගල සහ මාතර යන ගෝල්ෆ් පිටි, කොග්ගල මුහුදුගුවන් යානා කෞතුගාරය ආදිය රජය විසින් හඳුනාගෙන ඇත.බෝගම්බර සංස්කෘතික හා සංචාරක මධ්‍යස්ථානය හා මත්තල සංචාරක කලාපය වැනි සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පවති.ඉහළ වියදම් ධාරිතාවක් ඇති සංචාරකයින් ආකර්ශනය සඳහා මෙය වඩාත් ප්‍රසංශනීය වනු ඇත.

මීට අමතරව, සංචාරක කර්මාන්තය ආශ්‍රිත පවතින ගැටලු විසඳීමසඳහා රජය තිරසාර සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇති අතර එමගින්සංචාරක කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය (ජනප්‍රිය සහ ජනප්‍රිය නොවූ ගමනාන්තවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම), NVQ මට්ටමේ නිපුණතා සහිත10,000 ක් ශ්‍රමිකයින් පුහුණු කිරීම, ආයතනික සංවර්ධනය සිදු කිරීම අපේක්ෂා කරයි.

**විශේෂ කාර්යයන්**

- රේඛීය අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩලසංදේශ සඳහා නිරීක්ෂණ 02ක් ඉදිරිපත් කරන ලද අතර ව්‍යාපෘති යෝජනා 06ක් ඇගයීමට ලක් කර ඇත.
- රාජ්‍ය ආයෝජන වැඩසටහන යාවත්කාලීන කිරීම.
- ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා අදාළ රේඛීය ආයතන වෙත නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.
- ලෝක බැංකුතිරසාර සංචාරක සංවර්ධන ව්‍යාපෘතියසඳහා උපදේශනය.

**විදුලිබල හා බලශක්ති අංශය**

විදුලිබල හා බලශක්තිය ශ්‍රී ලංකා ආර්ථිකයෙහි ඉතා වැදගත් වූ අංශයකි. මෙම විදුලිබල හා බලශක්ති අංශය ආර්ථිකයේ විවිධ වූ ක්ෂේත්‍ර හා ඍජුවම සම්බන්ධ වෙමින් ජනතාවගේ සුභසාධනය කෙරෙහි දායකවන බැවින් එය ආර්ථිකයේ සුවිශේෂී සංරචකයක් වේ. තිරසාර සංවර්ධනයක් සහතික කිරීම උදෙසා ගුණාත්මක, විශ්වසනීය සහ ප්‍රමාණවත් යටිතල පහසුකම් සංවර්ධනයක් අත්‍යවශ්‍ය වන අතර විදුලිබල හා බලශක්ති අංශය සංවර්ධනය සඳහා එවන් අධි ඉල්ලුමක් සහිත වැදගත් අංශවලින් එකකි. වර්තමානයේ විදුලිබලය නිපදවීමේ මූලාශ්‍ර, ගල් අඟුරු, ස්වාභාවික වායු, ජල විදුලිය හා ඛනිජ තෙල් ආදී සම්ප්‍රදායික මූලාශ්‍රවල සිට සූර්ය බලශක්තිය, සුළං, මුහුදු තරංග, භූ උෂ්ණත්ව බලය හා ජෛවබලය ආදී වූ සම්ප්‍රදායික නොවන බලශක්ති මූලාශ්‍රයන් දක්වා වූ පරාසයක පැතිරී තිබේ. විදුලිබල හා බලශක්ති අංශයන් සඳහා වන ඉල්ලුම ශීඝ්‍රයෙන් ඉහළ යන බැවින් ශ්‍රී ලංකාවේ විදුලිබල හා බලශක්ති අංශය, කාබන් විමෝචනය අවම බලශක්ති අංශයක අරමුණු උල්ලංඝනය නොවන පරිදි එහි ස්ථාපිත ධාරිතාවය ඉහළ නැංවීම කෙරෙහි අවධානය යොමු කරමින් සිටියි. මෙම අංශයෙහි අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා රජයේ දායකත්වය 2018 වසර පුරාවටම ලැබුණු අතර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවද ඒ සඳහා පහත පරිදි සහාය දක්වන ලදී.

- මෙම කාලසීමාව තුළදී ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව ව්‍යාපෘති යෝජනා 12ක් ඇගයීමට ලක්කර නිරීක්ෂණ සපයන ලදී.
- අමාත්‍ය මණ්ඩල සංදේශ 5 ක් සඳහා නිරීක්ෂණ සපයන ලදී.
- විදුලිබල හා බලශක්ති අංශයට අදාළ විදේශ දූතමණ්ඩල ආශ්‍රිත කාරණා සම්බන්ධයෙන් නිරීක්ෂණ සපයන ලදී.
- ශ්‍රීලංකාව සහ ඉන්දියාව අතර දේශසීමා විදුලි වෙළඳාම පිළිබඳ වැඩමුළුව පැවැත්වීම සඳහා සහයෝගය දක්වන ලදී.
- ශ්‍රීලංකාවෙහි න්‍යෂ්ටික බල සංවර්ධන වැඩසටහන පිළිබඳ කමිටුව නියෝජනය කරන ලදී.
- ස්වාභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සැකසීමේදී තාක්ෂණික සහයෝගය ලබාදෙනලදී.

## 3.4 ප්‍රවාහන, මහාමාර්ග , වාරාය සහ ගුවන් සේවා

**ප්‍රවාහන**

නාගරික රථවාහන තදබදය අවම කිරීම, මාර්ග අනතුරු අඩු කිරීම, නාගරික ග්‍රාමීය සම්බන්ධතා වැඩිදියුණු කිරීම, නවීකරණය කිරීම තුළින් පොදු ප්‍රවාහන පහසුකම් ප්‍රවර්ධනය කිරීම මඟින් ප්‍රවාහන අංශයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම අරමුණු කරයි. මේ සම්බන්ධයෙන් මධ්‍යකාලීන ආයෝජන සඳහා ප්‍රමුඛ ක්ෂේත්‍ර ලෙස දුම්රිය මාර්ගජාලය සංවර්ධනය කිරීම, කොළඹ නාගරික ප්‍රදේශය තුළ දුම්රිය ජාලයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, දුම්රිය එංජින් සහ මැදිරි සංඛ්‍යාව වැඩිකිරීම, කොළඹ නාගරික ප්‍රදේශය තුළ සහැල්ලු දුම්රිය ගමනාගමන(LRT) පද්ධතිය සංවර්ධනය කිරීම සහ ලංගම බස්රථ සංඛ්‍යාව වැඩි කිරීම හඳුනාගෙන ඇත.

**මහාමාර්ග**

සුපුරුදු ලෙස ම, 2018 වර්ෂය මාර්ග අංශය සඳහා කාර්‍ය බහුල කාලයක් විය.අධිවේගී මාර්ග සංවර්ධනය, මාර්ග පුළුල් කිරීම සහ පුනරුත්ථාපනය, මාර්ග නඩත්තු කිරීම හා පාලම් ඉදිකිරීම වැනි ක්‍රියාකාරකම් ඒ අතර ප්‍රධාන විය.දේශීය හා විදේශීය මූලාශ්‍රවලින් මුදල් ලබා ගැනීම සඳහා ඇගයීමට නව ව්‍යාපෘති යෝජනා විශාල සංඛ්‍යාවක් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙතඉදිරිපත් විය.මෙම යෝජනා අතර ශක්‍යතා අධ්‍යයනයන්ගේ සිට මාර්ග පුනරුත්ථාපනය දක්වා වූ පරාසයක යෝජනා විය.ශක්‍යතා අධ්‍යයන, පාලම් නැවත ඉදිකිරීම සහ පුළුල් කිරීම, නව මාර්ග ඉදිකිරීම්, මාර්ග අංශවල නියෝජිත ආයතනයන් හි ධාරිතා වර්ධනය, අධිවේගී මාර්ග වැඩි දියුණු කිරීම සඳහා යෝජනාඒ අතර විය.මාර්ග ඔස්සේ පොදු උපයෝගිතාකොරිඩෝවක් ඉදිකිරීම සඳහා සැලසුම් සකස් කර ඇත.මෙම සංකල්පය වැඩිදියුණු කිරීම හා ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලිය තුළ සලකා බැලීමට මාර්ග අංශය වටිනා අදහස් දැක්විය.

**වරාය**

නාවික ක්ෂෙත්‍රය තුල මූලෝපායික වශයෙන් වැදගත් තැනක පිහිටා ඇති නිසා, ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වරායන් භාණ්ඩ මෙහෙයවීමේ කටයුතු සඳහා කාර්ය බහුල විය.සමුද්‍රීය මෙහෙයුම් වලවැඩිවන ඉල්ලුම සපුරාලීම සඳහා වරාය හා අදාළ යටිතල පහසුකම් සහ සේවාවන්හි වර්ධන කටයුතු වසර පුරා සිදු විය.ජාතික වරාය සහ සාමුද්‍රීය ප්‍රතිපත්තිය සකස් කිරීම වසර තුල සිදුවුන ප්‍රධානතම කාර්යයක් විය.අංශයේ සාමාජිකයින් කමිටු රැස්වීම්වලට සක්‍රියව සහභාගී වූ අතර එය සාර්ථක කර ගැනීමට වටිනා දායකත්වයක් ලබා දුනි.

**ගුවන්සේවා**

විශේෂයෙන්ම සංචාරක කටයුතු හා ජාත්‍යන්තර වෙළඳාම සඳහා ගුවන්සේවා සැපයීම සඳහා ලොව අනෙකුත් රටවල් සමඟ ශක්තිමත් ගුවන් සේවා ජාලයක් ස්ථාපිත කිරීමට මෙම අංශය අපේක්ෂා

කරයි. මධ්‍යකාලීන ආයෝජන සඳහා ප්‍රමුඛ ක්ෂේත්‍රලෙස කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ පහසුකම් පුළුල්කිරීමත්, ගුවන් ගමන් සඳහා නවගමනාන්ත හඳුනාගැනීම ත්දැක්විය හැකිය.

**විශේෂිත වූ කාර්යයන්**

- රේඛිය අමාත්‍යාංශය මගින් යොමු කළ ඉහත විෂයන් වලට අදාළ ව්‍යාපෘති යෝජනා සහ වැඩසටහන් 28 ක් ඇගයීම.
- මහාමාර්ග , ප්‍රවාහන, ගුවන් හා වරාය යන අංශයන්ට අදාළ ඉදිරි යෝජිත ව්‍යාපෘති ලැයිස්තුව සකස් කිරීම.
- මහාමාර්ග , ප්‍රවාහන, ගුවන් හා වරාය යන අංශ වලට ප්‍රතිපත්ති හා සංවර්ධන උපාය මාර්ග සකස් කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ වෙත අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම.
- පහත සඳහන් කමිටු වල සාමාජිකයෙකු ලෙස ක්‍රියා කිරීම.
    - ප්‍රවාහන ප්‍රතිපත්ති යටත්කාලීන කිරීමේ කමිටුව, මාර්ගප්‍රතිපත්තියසැකසීමේකමිටුව, ජාතිකවරායසහසාමුද්‍රීයප්‍රතිපත්තියසැකසීමේකමිටුව
    - සැහැල්ලු දුම්රිය (LRT) පද්ධතියේ නඩත්තු සහ මෙහෙයුම් යන්ත්‍රනය සකස් කිරීමේ කමිටුව
    - සැහැල්ලු දුම්රිය පද්ධතිය සහ කොළඹ නාගරික දුම්රිය නවීකරණය කිරීම, ඒකාබද්ධ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන, රුවන්පුර අධිවේගී මාර්ගය, දක්ෂිණ අධිවේගී මාර්ගදිගුව, ප්‍රමුඛතා මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යන ව්‍යාපෘති වල ව්‍යාපෘති මෙහෙයුම් කමිටු.
- විදේශ ආධාර සඳහා වන දූත මණ්ඩල සටහන් 13කට පමණ අදහස් දැක්වීම.
- මහාමාර්ග , ප්‍රවාහන, ගුවන් හා වරාය ක්ෂේත්‍ර වල පවතින කාලීන ගැටළු අධ්‍යනය කිරීම.
- මහාමාර්ගසහමාර්ගසංවර්ධනඅමාත්‍යාංශය , ප්‍රවාහනහා සිවිල්ගුවන්සේවාඅමාත්‍යාංශයසහ වරායහානාවිකඅමාත්‍යාංශයමගින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 11ක්සඳහා නිරීක්ෂණ ලබා දීම.
- ප්‍රගති සමාලෝජන කමිටු,මෙහෙයුම් කමිටු හා විදේශ ණය නියෝජිත ආයතන සමග වන රැස්වීම් ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම සඳහා වන රැස්වීම් 60 කට පමණ සහභාගී වීම.

**3.5 නාගරික සංවර්ධන, නිවාස හා ඉදිකිරීම්, ජල හා පරිසර**

**නාගරික සංවර්ධන**

නාගරික සංවර්ධන අංශය මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය හා සම්බන්ධව කටයුතු කරමින් රටතුල අක්‍රමවත් ලෙස ඇතිවී පවතින නාගරික යටිතලපහසුකම් විධිමත් ලෙස සකස්කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සහ උපායමාර්ග සම්පාදනයටත් ඒවා ක්‍රියාත්මක කිරීමටත් අවශ්‍ය දායකත්වය සපයනු ලබයි.මෙම අංශයේ උපායමාර්ගික දිශාවන් ප්‍රධාන වශයෙන් හඳුනා ගෙන ඇත්තේ ආංශීය වශයෙන් පවත්නා ගැටළු හා

අපහසුතාද, තිරසාර සංවර්ධන අරමුණු 11 යටතේ හඳුනාගෙන ඇති සියලු දේ අන්තර්ගත සුරක්ෂිත ඔරොත්තු දෙන තිරසර නගර ඇති කිරීම යන ඉලක්කයන්ද සලකා බැලීමෙනි.

**ක්‍රියාකාරකම්**

- මෙම අංශය මගින් 2018 වසර සඳහා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 11කටත් , ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 01කටත් නිරීක්ෂණ සපයා ඇත.
- නාගරික සංවර්ධනය හා නගර සැලසුම් කිරීම සම්බන්ධ ව්‍යාපෘති යෝජනා 335ක් මෙම කාලය තුල මෙම අංශය වෙත ලැබී තිබූ අතර ඉන් ව්‍යාපෘති යෝජනා 266ක් ඇගයීමට ලක් කර අවශ්‍ය කටයුතු සඳහා යොමුකර ඇත.
- නාගරික සංවර්ධන අංශය සඳහා ඉදිරි වර්ෂ තුල ක්‍රියාත්මක කිරීමේ අරමුණින් යෝජනාවී ඇති ව්‍යාපෘති සලකා බලා ව්‍යපෘති පෙළගැස්ම යාවත්කාලීන කිරීම.
- 2019 අයවැය සඳහා නාගරික සංවර්ධන අංශය සඳහා වන ප්‍රමුඛ ව්‍යාපෘති හඳුනාගෙන ඉදිරිපත්කිරීම තුලින් අයවැය සකස්කිරීමට දායකවීම.

**රැස්වීම් සහ ප්‍රතිපත්තිමය සාකච්ඡා සඳහා සහභාගීත්වය**

- රේඛීය අමාත්‍යාංශ සහ අනෙකුත් රජයේ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා 2018 වර්ෂයේදී රැස්වීම් පැවැත්වීම.

**නිවාස හා ඉදිකිරීම්**

මෙම අංශය මගින් නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රය සම්බන්ධ කටයුතු ප්‍රධාන වශයෙන් සිදු කරනු ලබයිමෙම . කාර්යයන් නිවාස හා ඉදිකිරීම්අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව සිදු කරන ලදී.

අන්ත අසරණ භාවයට පත්වූවන්ගේ එනම් ග්‍රාමීය දිළිඳු ප්‍රජාව නාගරික සහ අර්ධ නාගරි ,ජාවවැවිලි ප්‍ර ,ක අඩු පහසුකම් ජනාවාසවල වෙසන පදිංචිකරුවන් සහ ගැටුම්වලින් පීඩාවට පත් පුද්ගලයින්ගේ නිවාස අවශ්‍යතා සපුරාලීම සඳහා මූල්‍ය ප්‍රදාන සහ ආධාර සහනදායි ණය සහ , ආදාන හා ධාරමය ප්‍රව්‍යද , තාක්ෂණික සහාය ලබා දීම සිදු කරන අතර දැරිය හැකි කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් පෞද්ගලික අංශයට නිවාස වෙළඳපොලෙහි ආයෝජනට සුදුසු පරිසරයක් ඇති කිරීම රාජ්‍ය නිවාස ප්‍රතිපත්තිය යටතේ සිදු කරනු ලබයි.

**සම්පූර්ණ කරන ලද අංශයේ විශේෂ ක්‍රියාකාරකම්**

**ව්‍යාපෘති ඇගයීම**

ව්‍යාපෘති යෝජනා 19 ක් ලැබුණු අතර ඉන් 12 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ඇගයීමට ලක් කර නිරීක්ෂණ ජාතික අයවැය හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී.

- අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සැකසීම.
- නිවාස හා ඉදිකිරීම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු, කර්මාන්ත හා වෙළඳ සහ මහානගර සහ බස්නාහිර සංවර්ධන යන අමාත්‍යාංශහා බන්ධනාගාර, නැවත පදිංචි කිරීම් හා හින්දු කටයුතු අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 4 ක් සඳහා නිරීක්ෂණ සකස් කිරීම.
- රැස්වීම් සහ ප්‍රතිපත්තිමය සාකච්ඡා සඳහා සහභාගී වීම.
- ඉදිකිරීම් කර්මාන්තය ආශ්‍රිත පාර්ශවකරුවන් මුහුණ දෙන ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා 2018 වර්ෂයේදී රැස්වීම් මාලාවක් පැවැත්වීම.
- නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගි වීම

**ජල සම්පාදනය හා සනීපාරක්ෂාව**

ජනතාවගේ ජීවන තත්ත්වය හා රටේ සමාජ ආර්ථික සංවර්ධනය ඉහල නැංවීම සඳහා ජනතාවට අවශ්‍ය ආරක්ෂිතපානීය ජලය හා දියුණු සනීපාරක්ෂක පහසුකම් සැපයීම අත්‍යාවශ්‍ය වේ.ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව නගර සැලසුම්,ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ,ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය,ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව හා අනෙකුත් ආංශීය පාර්ශවකරුවන් සමඟ සමීපව වැඩකටයුතු කරන අතර ආංශීය ප්‍රතිපත්ති සම්පාදනයේදී හා ව්‍යාපෘති, වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය ප්‍රතිපත්තිමය යෙදවුම් සහ මඟ පෙන්වීම් මෙම ආයතන වලට සැපයීම සිදු කරනු ලැබේ. තවද, මෙම වසර තුළ පහත දැක්වෙන ආංශීය කාර්යයන් මෙම අංශය මගින් නිම කර ඇත.

- නගර සැලසුම් ,ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා අදාළ අනෙකුත් ආයතන විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා 17 ක මූලික අධ්‍යයන සිදු කරන ලදී.ඒවා සම්බන්ධයෙන් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ හා ව්‍යාපෘති වලට අදාළව සකස් කරන ලද නිර්දේශ වාර්තා අදාළ පරිදි ජාතික අයවැය දෙපාර්තමේන්තුවට හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට හා අදාළ රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී.
- අදාළ අමාත්‍යාංශය විසින් යොමු කරන ලද අමාත්‍යමණ්ඩල සංදේශවලටඅදාළ නිරීක්ෂණ ලබා දීම.
- විදේශීය ණය නියෝජිතායතන විසින් ඉදිරිපත් කරන ලද විදේශීය ණය ගිවිසුම් සම්බන්ධයෙන් වන සටහන් (Aide Memoires)04 කට පමණ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත නිරීක්ෂණ ලබා දීම හා විදේශීය දූත මණ්ඩලවල ඉල්ලීම මත ජල සම්පාදනය හා ජලාපවාහනය සම්බන්ධ කරුණු

සාකච්ඡා කිරීමට අදාළ විදේශීය දූත මණ්ඩලආරම්භක රැස්වීම් ( Kick off ) 05 ක් දෙපාර්තමේන්තුව තුළ සංවිධානය කිරීම.

- ප්‍රගති සමාලෝචන කමිටු ,මෙහෙයුම් කමිටු ,විදේශීය ණය නියෝජිතායතන සමඟ පවත්වන රැස්වීම් ආදී රැස්වීම් 20 කට පමණ සහභාගී වීම.
- ආංශීය අමාත්‍යාංශය විසින් යොමු කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන්හී පවත්නා ගැටළු තත්ත්වයන් සාකච්ඡා කිරීමට අවශ්‍ය පරිදි රැස්වීම් සංවිධානය කිරීම හා ඊට අදාළ පසු ක්‍රියාමාර්ග ගෙන ඇත.
- සිංහරාජ විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන සකස් කිරීම සඳහා අංශයට අදාළ තොරතුරු සපයමින් සහය වීම.

**පරිසර කළමනාකරණය**

නියමිත ආයෝජනයන් සිදු කරමින් ශක්තිමත් ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට පහසුකම් සපසන අතරතුරදී පාරිසරික ගුණාත්මක බව තහවුරු කරමින් තිරසාර සංවර්ධනයක් කෙරෙහි යොමු වීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම පරිසර කළමනාකරණය තුළින් බලාපොරොත්තු වේ. දූෂණයෙන් තොර පරිසරයක් හා වස-විසෙන් තොර ආහාර රටාවක් තහවුරු කිරීම සඳහා පරිසර ප්‍රතිපත්තිය තුළ හරිත සංවර්ධනය යන සංකල්පය වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි.දිනෙන් දින වර්ධනය වන ජනගහනයේ ප්‍රතිඵලයක් ලෙස ආහාර, ජලය, බලශක්තිය , ඉඩම්, හා අනෙකුත් ස්වාභාවික සම්පත් සඳහා වන ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් හරිත, පිරිසිදු සහ අනුහුරු සංවර්ධනයක් ළඟා කර ගැනීමේ ගෝලීය අපේක්ෂාව බරපතල අභියෝගයකට ලක්ව තිබේ. පරිසර විනාශයේ ප්‍රතිඵලයක් මෙන්ම ඊට හේතුකාරකයක් ද වන දේශගුණික විපර්යාස තවත් විශේෂිත අභියෝග රැසක් මතු කරයි. ශීඝ්‍ර දේශගුණ විපර්යාසයන්ගේ බලපෑම් තිරසාර සංවර්ධනය ළඟා කර ගැනීමේ අවස්ථාව දුර්වල කරන අතරම දිළිඳුකම පිටු දැකීම සඳහා ඇති සම්පත් මෙන්ම කාල පරාසයද සීමා කරයි. එබැවින් පිරිසිදු, වඩා කාර්යක්ෂම සහ සාධාරණ ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීම සඳහා වූ සුදුසු වැඩපිළිවෙලක අවශ්‍යතාවය මතුව තිබේ. මේ අනුව සංවර්ධන ආර්ථිකයන්හි ඉතා වැදගත් අංශයක් ලෙස පරිසරය සැලකිය හැකි අතර එය නවීන ආර්ථික විද්‍යාවෙහි අළුතින් මතු වී එන අංගයක් වේ.පරිසර කළමනාකරණයේ විෂය පථයට පරිසර දූෂණය පාලනය කිරීම, කසළ කළමනාකරණය, වනාන්තර සංරක්ෂණය, තිරසාර ඉඩම් කළමනාකරණය, මිනිස් - වනජීවි සහ පැවැත්ම, ජීවී සම්පත් සංරක්ෂණය සහ ආයතනික ප්‍රතිව්‍යුහගතකරණය ආදිය අතුළත් වේ.අවම කාබන් පරිහරණයකින් යුතු පිරිසිදු හරිත පරිසරයක් ළඟා කර ගැනීම, පරිසර දූෂණය අවම කිරීම, ඉහළ ජෛවවිවිධත්වය සහ පරිසර පද්ධති සේවා, පාරිසරික අවදානම අඩු කිරීම කාර්යක්ෂම සහ තිරසාර සම්පත් පරිභෝජනය තුළින් ජීවන තත්ත්වය උසස් කිරීම, පාරිසරික ගුණාත්මක බව ඉහළ නැංවීම සහ සුවාභාවික උපද්‍රවයන්ගේ බලපෑම් අවම කිරීම යන කරුණු කෙරෙහි පරිසර කළමනාකරණ අංශයේ අවධානය යොමු වී ඇත. තරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා මනා පරිසර කළමනාකරණය ඉතාමත් වැදගත්

අවශ්‍යතාවයක් වේ. එබැවින් සංවර්ධන සැලසුම්කරණයේදී පාරිසරික සමතුලිතතාවය පවක්වාගෙන යාමට අත්‍යවශ්‍ය වන ජෛවවිවිධත්වය සංරක්ෂණය හා පරිසර පද්ධති පිළිබඳ නිසි අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය වේ.

**ආපදා කළමනාකරණය**

ආපදා තත්වයන්ගෙන් වන හානිය රටෙහි ආර්ථික සංවර්ධනයට බාධාවක් වන වේ. හදිසි ආපදා තත්ත්වයන් ඇතිවීමෙන් පසු ඒ සඳහා වන්දි , සහනාධාර , පුනුරුත්ථාපන නැවත ඉදි කිරීම් සඳහා වැය වනුයේ රටෙහි සංවර්ධනය සඳහා සහ සමාජ සංරක්ෂණය සඳහා යොදා ගත හැකි සීමිත සම්පත් වේ. ශ්‍රී ලංකාව අහිතකර කාලගුණ බලපෑම් සඳහා ඉලක්ක වන අතර කාළගුණ විපර්යාසයන්ගේ බලපෑම මෙම තත්ත්වය වඩාත් තීර්ව කරයි. ශ්‍රී ලංකාව ගංවතුර , නායයෑම් , නියඟ , වෙරළාශ්‍රිත කුණාටු වැනි ආපදා තත්ත්වයන්ට නිරතුරුව මුහුණ දේ. කාළගුණ බලපෑම් හේතුවෙන් වර්ෂාපතනයෙහි සිදුවන වෙනස් වීම් , රටෙහි ඉතා අධික වර්ෂාපතන තත්වයන් ඇති වීමට මූලික වන අතර එමඟින් පහත් බිම් ප්‍රදේශයන්හි ගංවතුර තත්වයන් ඇති වීමට හේතු වේ. එසේම වියළි කලාපයන්හි දැඩි නියඟ තත්වයන්ද දක්නට ලැබේ. එබැවින් ආපදා කළමනාකරණය කෙරෙහි රජය විශාල අවධානයක් යොමු කොට ඇත.

**විශේෂ අවස්ථා**

1. පරිසර කළමනාකරණයසහ ආපදා කළමණාකරණයට අදාලව ව්‍යාපෘති 18 ක් ඇගයීමට ලක් කරන ලදී.***(උදා: වන වගා ස්ථාපිත කිරීම , කාබන් වෙළඳ පොළ සඳහා අදාල වන ප්‍රතිපත්ති සම්බන්ධව මාර්ග සිතියන් සංවර්ධනය , සෞඛ්‍ය හා පරිසර ප්‍රතිපත්ති වලට අදාලව වායුගෝලයෙහි ගුණාත්මක තත්වය සංවර්ධනය,පූර්ව සංඥා තාක්ෂණය සංවර්ධනය , ගොඩනැගිලි වල ක්ෂය වීම් සහ සේවා කාලය දික් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂණය)***
2. රේඛීය අමාත්‍යාංශ විසින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 10 ක් සඳහා නිරීක්ෂණ සැපයීම.
3. ප්‍රතිපත්ති ක්‍රමෝපායන් සැකසීම රටෙහි සංවර්ධනය රාමුවට අනුකූල වන පරිදි සහා ව්‍යාපෘති සංවර්ධනය සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සහ ආයතන වෙත තාක්ෂණික සහයෝගය ලබා දීම.
4. විදේශ ආධාර ආයතනයන් හරහා ක්‍රියාත්මක වන තාක්ෂණික සහය ක්‍රියාවලීන් සඳහා අනුමැතිය ලබා දීම

### 3.6 සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය , ක්‍රීඩා හා සංස්කෘතික

දීර්ඝ ආයු අපේක්ෂාව,බෝවන රෝග පැතිරීම අවම මට්ටමක පවත්වා ගැනීම, මාතෘ හා ළමා සෞඛ්‍ය ඉහළ මට්ටමක පවත්වා ගැනීම වැනි දර්ශකයන් සෞඛ්‍ය අංශයන්හි සැලකිය යුතු මට්ටමක සාර්ථකත්වයක් ලබා තිබෙන නමුත් ජන විකාශන රටාවෙහි ඇති වන වෙනස් වීම, බෝ නොවන රෝග ව්‍යාප්තිය වැඩි වීම වැනි

ප්‍රවනතාවයන්ට සමගාමීව සෞඛ්‍ය සේවාවන් සඳහා වනඉල්ලුම ඉහළ යමින් පවතී. එහෙයින් එම අවශ්‍යතා සපුරාලීම සඳහා ඉහළ ගුණාත්මක භාවයකින් යුතු සෞඛ්‍ය පහසුකම් ලබා දීම සඳහා ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය පද්ධතිය තව දුරටත් ශක්තිමත් කිරීම අවශ්‍ය වේ. එබැවින්, රජය විසින් විවිධ සෞඛ්‍ය ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය හදුන්වාදීම හා සෞඛ්‍ය සේවා පහසුකම් සැපයීම සඳහා වන අයෝජනය වැඩි කිරීම සිදු කරන ලදී. 2018 වර්ෂය තුළදී, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් ඉහත සඳහන් ඉලක්ක ලභා කර ගැනීම සඳහා සෞඛ්‍ය අංශය වෙනුවෙන් පහත සඳහන් කාර්යන් ඉටු කරන ලදී.

- ව්‍යාපෘති යෝජනා 42ක් ඇගයීමට ලක් කර ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ කර තිබේ. එම නිරික්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුව,විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා අනෙකුත් අදාළ ආයතන වෙත ඉදිරිපත් කරන ලදී.
- සෞඛ්‍ය,පෝෂණ හා දේශිය වෛද්‍ය අමාත්‍යාංශය මගින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 6 ක් සඳහා නිරික්ෂණ සකසන ලදී.
- 2019 - 2023 කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රාථමික සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සැකසීම හා ප්‍රතිපාදන ලබා දීම පාදක කරගත් දර්ශක හදුනා ගැනීම සඳහා අවශ්‍ය යෙදවුම් ලබා දෙන ලදී.
- සෞඛ්‍ය අංශයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍යය මුල්‍ය සහයෝගය ලබා ගැනීම සඳහා ලෝක බැංකුව, ජපන් සහයෝගිතා එජන්සිය, ලෝක සෞඛ්‍යසංවිධානය ආදී ආයතනවල නිලධාරීන් සමඟ රැස්වීම ගණනාවක් පවත්වනු ලැබිණ.
- ප්‍රාථමික සෞඛ්‍යප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයට අවශ්‍ය යෙදවුම් සපයනු ලැබින.
- "ශ්‍රී ලංකාවේ පෝෂණය සඳහා වැය වන රජයේ පිරිවැය" යන මැයෙන් වන අධ්‍යනය සිදු කිරීම සඳහා ස්ථාපිත කරන ලද වැඩ තාක්ෂණ කමිටුව ( working group) සම්බන්ධීකරණය කරන ආයතන ලෙස ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව ක්‍රියා කරන ලදී

ඒ අනුව,ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් 2018 ඔක්තෝම්බර් 05 වැනි දින ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ සහාගීත්වයෙන් යුතුව විවිධ පාර්ශවකරුවන් සඳහා රැස්වීමක් මිලෝදා ආයතනයෙහි පැවැත්වීමටත්, අනතුරුව වැඩ කණ්ඩායමෙහි පළමු තාක්ෂණික රැස්වීම 2018 දෙසැම්බර් මස 12 වන දින කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී පැවැත්වීමටත් අවශ්‍ය කටයුතු සංවිධානය කරන ලදී.

**ක්‍රීඩා අංශය**

ක්‍රීඩා අංශය වැඩිදියුණු කිරීමේ අරමුණින් ක්‍රීඩා පිට්ටනි ඉදිකිරීම, ක්‍රීඩා උපකරන මිලදී ගැනීම ඇතුළු තවත් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා රජය 2018 වර්ෂය සඳහා මුදල් ආයෝජනය කර ඇත.

එසේම ජනතාව බෝනොවන රෝග වලින් වලක්වා සෞඛ්‍ය සම්පන්න දේශයක් බිහි කිරීම සහ ඒ සඳහා දරණ රාජ්‍ය වියදම් අඩු කරමින් රටේ ආර්ථික, සාමාජීය. සංස්කෘතික වශයෙන් අන්තර් සම්බන්දතාවයක් ඇති කිරීම ක්‍රීඩාව දියුණු කිරීම තුළින් බලාපොරොත්තු වේ.

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂය තුළ පහත සඳහන් වැඩ කටයුතු ඉටු කර ඇත.

- 2018 වර්ෂයට ලැබුණු ව්‍යාපෘති වාර්තා දෙකක් ඇගයීමට ලක්කර ජාතික අයවැය හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ලබා දී ඇත
- 2017-2020 රාජ්‍ය ආයෝජන සැලැස්මෙහි යාවත්කාලීන කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීම ක්‍රීඩා අමාත්‍යාංශය හා අනෙකුත් ආයතන සමඟ රුස්වීම් පවත්වා ඇත

**ආගමික, සංස්කෘතික සහ උරුමයන්, ජාතික සහජීවනය, සංවාද සහ රාජ්‍ය භාෂා අංශය.**

මෙම අංශය යටතේ , බුද්ධ ශාසන සහ වයඹ පළාත් සංවර්ධන අමාත්‍යාංශය, ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා සමාජ සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු, සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතුඅමාත්‍යාංශය, තැපැල්, තැපැල් සේවා සහ මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය, නිවාස ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යාංශය යන අමාත්‍යාංශ යටතේ විෂයන්හි සංවර්ධන කටයුතු පිළිබඳ සලකා බලයි.

මෙම අමාත්‍යාංශ මඟින් බුද්ධ ශාසන, හින්දු, ක්‍රිස්තියානි සහ මුස්ලිම් යන ආගම් ද සංස්කෘතිය හා උරුමයන්, පුරාවිද්‍යාව, ජාතික ලේඛණාරක්ෂාව, ජාතික කෞතුකාගාරය, කන්ද උඩරට උරුමය, රාජ්‍ය භාෂා සහ සමාජ ඒකාබද්ධතාවය යන ක්ෂේත්‍රයන් ආවරණය කරනු ලැබේ.

ඉහත සඳහන් අමාත්‍යාංශයන් සම්බන්ධයෙන් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් 2018 වසර තුළ පහත සඳහන් ක්‍රියාමාර්ග ගනු ලැබුණි.

- ඉහත සඳහන් අමාත්‍යාංශ වෙතින් 2018 ව්‍යාපෘති වාර්තා 20ක් සඳහා ජාතික අයවැය හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ලබා දී ඇත.
- ජාතික සංහිඳියා, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ පවත්වන ලද උපදේශන රැස්වීම් කමිටු සඳහා සහභාගී වීම.

**3.7 අධ්‍යාපන උසස් අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන , තොරතුරුතාක්ෂණ , විද්‍යා හා තාක්ෂණ**

**අධ්‍යාපනය**

අධ්‍යාපනයේ ගුණාත්මකබව, සමානාත්මතාව හා අදාළබව වැඩිදියුණු කිරීමට ව්‍යාපෘති, වැඩසටහන් හා ක්‍රමෝපායන් රාශියක් 2018 වසරේදී හඳුන්වාදෙන ලදි. මෙම ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම සඳහා

යටිතල පහසුකම් සංවර්ධනය සහ අවශ්‍ය මානව සම්පත් සංවර්ධනය ඇතුළුව පාසැල් පද්ධතියේ සිදු කළ යුතු වන වෙනස් කම් සිදු කිරීම සඳහා ප්‍රමුඛ අවධානයක් යොමු කෙරිණ.

තවද, පානීය ජල පහසුකම්, සනීපාරක්ෂක පහසුකම්, පන්ති කාමර, විද්‍යාගාර සහ විද්‍යාගාර උපකරණ වැනි අවශ්‍ය මූලික පහසුකම් පාසැල්වල ස්ථාපනය කිරීම සඳහා ව්‍යාපෘති හා වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කෙරිණ.

**2018 වර්ෂයේදී ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන්**

- අධ්‍යාපන අමාත්‍යාංශය හා අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සමග පැවති අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉදිරි මග සහ යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ සාකච්ඡා සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම.
- අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන **(ESDP)**, සාමාන්‍ය අධ්‍යාපනය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය**(GEM)** යන ව්‍යාපෘතිවල මෙහෙයුම් කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම සහ මෙරටට පැමිණෙන නියෝජිත කණ්ඩායම් සඳහා රැස්වීම් සංවිධානය කිරීම හා ඒවාට සහභාගී වීම.
- අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා ඇතුළත් කරමින් ඉදිරි ව්‍යාපෘති පෙළගැස්ම යාවත්කාලීන කිරීම.
- අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ **11**ක් සඳහා නිරීක්ෂණ සැපයීම.
- අධ්‍යාපන අංශයේ නව ව්‍යාපෘති සහ වැඩසටහන් **9** ක් ඇගයීම**.**

**උසස් අධ්‍යාපන**

2018 වර්ෂය තුළ, උසස් අධ්‍යාපන අංශය තවදුරටත් වර්ධනය වූ අතර, රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කල අතරම, විශේෂයෙන්ම අ.පො.ස (උසස්/පෙළ) තාක්ෂණවේදී විෂය ධාරාව හදාරන ලද සිසුන් සඳහා විශ්වවිද්‍යාල වරම් ලබා දීම සඳහා තාක්ෂණවේද පීඨ ඇතුළු නව අධ්‍යයන පීඨ ආරම්භ කරන ලදී. එමෙන්ම, නව අධ්‍යයන පාඨමාලා හඳුන්වා දීම සහ පවතින අධ්‍යයන පාඨමාලා නවීකරණය කිරීම මඟින් නිසි රැකියා අවස්ථා ලබා ගත හැකි උපාධිධාරීන් බිහිකිරීම පිළිබඳ ප්‍රමුඛ අවධානයක් යොමු කෙරිණ. ඊට අමතරව, කර්මාන්ත අංශය සමඟ සබඳතා ගොඩනගාගැනීම සඳහා විශ්වවිද්‍යාල රැසක් විසින් පියවර ගන්නා ලද අතර, විශ්වවිද්‍යාල තුළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු නැංවීම සඳහා අවශ්‍ය පහසුකම් ස්ථාපනය කරන ලදී.

රටේ ශිෂ්‍ය ප්‍රජාවට පවතින උසස් අධ්‍යාපන අවස්ථා නංවාලීමේ අරමුණින්, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන විධිමත් කිරීමට ද, ඒවා තවදුරටත් පුළුල් කිරීමට ද පියවර රැසක් ගන්නා ලදී.

**2018 වර්ෂයේදී ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන්**

- රාජ්‍ය විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි වන සිසුන් සඳහා රාජ්‍ය නොවන විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීමට ණය පහසුකම් ලබා දීමේ යෝජනා ක්‍රමයපිළිබඳ සාකච්ඡා සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම.
- උසස්අධ්‍යාපන අංශයේ විදේශ ආධාර මත ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘතිවල මෙහෙයුම් කමිටු රැස්වීම් සඳහාසහභාගීවීමසහජ්පිළිබඳවමෙරටටපැමිණෙනනියෝජිතකණ්ඩායම්සඳහාරැස්වීම්සංවිධානය කිරීමහාජ්වාටසහභාගීවීම
- උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් සහ අදාළ ආයතනයන්ගෙන් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා ඇතුළත් කරමින් ඉදිරි ව්‍යාපෘති පෙළගැස්ම යාවත්කාලීන කිරීම.
- උසස් අධ්‍යාපන අංශයේ නව ව්‍යාපෘති සහ වැඩසටහන් 33ක් ඇගයීම.

**තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන**

තොරතුරු තාක්ෂණය, මාධ්‍ය, තැපැල් හා විදුලි සංදේශ යන අංශවලින් තොරතුරු හා සන්නිවේදන අංශය සමන්විත වේ. තොරතුරු තාක්ෂණ සම්බන්ධ සේවා, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ව්‍යාපාර බාහිරකරණ (ICT/BPO) සහ දැනුම් බාහිරකරණ (ICT/KPO) යන ආදායම් උපයන කර්මාන්ත තොරතුරු තාක්ෂණ අංශයට ඇතුළත්ය.

ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය දැනුම පාදක කරගත් සේවා අංශයක් ලෙස ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකිය. මෙම අංශය තුළ තොරතුරු හා සන්නිවේදන පහසුකම් ඉහළ නැංවීම, තොරතුරු හා සන්නිවේදන මාධ්‍ය වෙත ළඟාවීම පහසු කිරීම, ඉ-රාජ්‍ය සේවා ප්‍රවර්ධනය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයට වැදගත්වන නීතිමය පසුබිම සැකසීම යන කරුණු කෙරෙහි රජය මූලික අවධානය යොමු කරන අතර, පද්ධති වැඩිදියුණු කිරීමේ ජාත්‍යන්තර ප්‍රමිතීන් සාක්ෂාත් කර ගැනීම අරමුණු කරගත් සේවා සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම තුළ පෞද්ගලික අංශය අතිශය වැදගත් කාර්ය භාරයක් ඉටුකරයි.තවද2018වර්ෂයේදී,වෙබ්අඩවිවලආරක්ෂාවතහවුරුකිරීමහාඅන්තර් ජාලයභාවිතයෙන්සිදුවනඅප යෝජනඅවමකිරීමඅරමුණුකොටගත්ව්‍යාපෘතිසඳහාවිශේෂඅවධානයයොමුකෙරුණි.

**2018 වර්ෂයේදී නිමකළකාර්යයන්**

- අදාළ අමාත්‍යාංශ මගින් යොමු කරන ලද නව ව්‍යාපෘති යෝජනා 15ක් ඇගයීමට ලක්කර ඇත
- තොරතුරු තාක්ෂණ අංශය සඳහා ව්‍යාපෘති ප්‍රමුඛතා ලේඛනය (Project Pipeline) සකස් කිරීම
- විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ, තැපැල් හා ජනමාධ්‍ය අංශවල අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 03කට නිරීක්ෂණ සපයා ඇත
- රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහා ආංශික සටහන් සැකසීම

- තොරතුරු තාක්ෂණහා සන්නිවේදන අංශයට අදාල රැස්වීම් සඳහා සහභාගි වීම
- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සඳහා ලේඛන කළමනාකරණ පද්ධතියක් සකස්කිරීම සඳහා අවශ්‍ය වන මූලික කටයුතු සකස් කිරීම, ඒ සඳහා අවශ්‍ය ව්‍යාපෘති වාර්තාව සකස්කිරීම හා එය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබාගැනීම, අවශ්‍ය දත්ත ඇතුලත්කිරීමේ සැකිල්ල සකස්කිරීම, මෘදුකාංගය සකස්කිරීම සඳහා ශ්‍රීලංකා තොරතුරුතාක්ෂණ ආයතනය වෙත ලබාදීම හා ඔවුන් සමඟ සමීපව කටයුතුකරමින් අවශ්‍ය මගපෙන්වීම ලබාදීම.

**විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ**

ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූලව මෙරට තාක්ෂණ හාපර්යේෂණ අංශය සංවර්ධනය කිරීම රජයේ ප්‍රධාන ඉලක්කයකි. අධිතාක්ෂණික කර්මාන්තකරණය රටක ශීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් කරා යොමුකරයි. දේශීය සමාගම්වල ගුණාත්මක භාවය, ඵලදායීතාව යස හතරගකාරිත්වය වැඩිදියුණුකිරීම සඳහා රජය ඉහළතාක්ෂණික කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමසඳහා පියවර කිහිපයක් ගෙනතිබේ. නැනෝතාක්ෂණය සහ ජෛවතාක්ෂණය ඇතුළු උසස් තාක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳපර්යේෂණ සහ සංවර්ධනය ආහාර සැකසීම, පටකරෝපණය සහ පොහොර වැනි කර්මාන්ත සඳහා අගයක් එකතුකර ඇත.

**නිමකළ කාර්යයන්**

- ව්‍යාපෘති වාර්තා11 ක් විශ්ලේෂණය කර අදාල නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුවහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවවෙත යොමු කිරීම
- විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ව්‍යාපෘතියෝජනා ඇගයීම පිළිබඳ සාකච්ඡා කීපයකට සහභාගීවීම
- මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයට අයත් තාක්ෂණික නගර සංවර්ධන වැඩසටහන යසකස්කොට ඇති විද්‍යා හා තාක්ෂණ අංශයට අදාල ව්‍යාපෘති නැවත සකස්කිරීම සඳහා දැනුවත් කිරීමේ සාකච්ඡා පැවැත්වීම
- "රාජ්‍යසේවා විශිෂ්ටත්වය සඳහා පෙරදැක්ම හා නව්‍යකරණය" නම්වූ වැඩමුළුවට සහභාගී වූ අතර හොඳම ව්‍යාපෘතිය සඳහා සම්මාන ලැබීම

**නිපුණතා අධ්‍යාපන හා තරුණ කටයුතු අංශය**

රටෙහි තිරසාර ආර්ථික සංවර්ධනක් සඳහා ඉහළ නිපුණතාවයකින් යුත් ශ්‍රමබලකායක්සිටීම අවශ්‍ය වේ. එබැවින් වසර 2020 වන විට ජාතික වෘත්තීය සුදුසුකම් සහිත 175,000 ක්ද ඇතුළුව වසරකට විවිධ ක්ෂේත්‍රයන්ට අදාල නිපුණතා සහිත තරුණ, තරුණියන් 250,000 ක් බිහිකිරීම අරමුණු කර ඇත. මෙහිදී හැකියාවන්, මෘදු කුසලතාවයන් වැඩිදියුණු කිරීමත් වෘත්තීය පුහුණු පහසුකම් ලබා ගැනීමට ඇති හැකියාව සහ ගුණාත්මක වෘත්තීය පුහුණුවකට ඇති ප්‍රවේශය ශක්තිමත් කිරීමත් තුලින් ගෝලීය ආර්ථිකය තුළ සේවා නියුක්ත විය හැකි ශ්‍රී ලාංකිකයෙකු බිහිකිරීම මූලික ප්‍රතිපත්තිය වේ.

**2018 වර්ෂයේදී ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන්**

- ව්‍යාපෘති වාර්තා 11ක් ඇගයීමට ලැබුණු අතර ව්‍යාපෘති අවශ්‍යතාවය නිසි ලෙස සාධාරනීකරණය කර ඇති ව්‍යාපෘති ඇගයීම් කර අවසන් කර ඇති අතර ඊට අදාල නිරීක්ෂණ එකී ආයතන, විදෙස් සම්පත් දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබේ.

- ව්‍යාපෘති සැකසීමට අදාල ගැටළු හා ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කරන විට අන්තර් ගත කල යුතු කරුණු හා ඒවා ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ රාජ්‍ය අංශයේ විවිධ අමාත්‍යාංශ යටතේ ඇති විවිධ නිපුණතා සංවර්ධන ආයතන සමඟ හා සංවර්ධන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පවත්වා දැනුවත් කිරීම.

- එමෙන්ම අලුතෙන් හඳුන්වාදෙන ලද ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතිය යටතේ නව ව්‍යාපෘති වාර්තා සකස්කල යුතු ආකාරය පිළිබඳ පැහැදිලි කිරීම සඳහා අදාල පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වීම.

- තවද, වසර 13ක අනිවාර්ය අධ්‍යාපන ප්‍රතිපත්තිය සමඟ ඒකාබද්ධ වෙමින් වෘත්තීය පුහුණුව සඳහා ඇතුලත් වන සංඛ්‍යාව ඉහළ නැංවීම සම්බන්ධවත් එහිදී පාසැල් හැරයන්නන් වෘත්තීය පුහුණු අංශය කරා යොමු කරවා ගැනීම සම්බන්ධවත් ගැනීමට අවශ්‍ය පියවර හා ක්‍රමෝපායන් සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබා දෙන ලද අතර වෘත්තීය පුහුණු අධ්‍යාපනයේ ගුණත්වය හා අදාලත්වය ඉහළ නැංවීම පිළිබඳ සාකච්ඡා පැවැත්වීම.

- රාජ්‍ය ආයෝජන සැලැස්ම යටතේ නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අංශයේ ඉදිරි සැලසුම් හා ආයෝජන ව්‍යාපෘති ප්‍රමුඛතා ගත කිරීම හා ලැයිස්තුගත කිරීම.

නිපුණතා ආංශීය සංවර්ධන වැඩසටහනට අදාලව අන්තර් අමාත්‍යාංශ කමිටු රැස්වීම පැවැත්වීම හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ අදාල නිලධාරීන් සමඟ සාකච්ඡා පවත්වා ගැටළු විසඳීමට පියවර ගැනීම.

**3.8 ප්‍රාදේශීය සංවර්ධනය සහ සමාජ ආරක්ෂණය**

**ප්‍රාදේශීය සංවර්ධනය**

පවත්නා ප්‍රාදේශීය විභවතාවත්, සුවිශේෂතා හා විවිධතා හඳුනාගනිමින් සෑම ප්‍රජාවකගේම ජීවන තත්ත්වයක් ඉහළ මට්ටමකට දියුණු කිරීම ප්‍රාදේශීය සංවර්ධන අංශයේ ජාතික ප්‍රතිපත්තිය වේ.

ජාතික මට්ටමේ සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනිම සඳහා ඒ ඒ පළාත්වල පවතින සම්පත් ප්‍රශස්ත හා තිරසාර මට්ටමින් භාවිතයට ගැනිමේ වැදගත්කම මෙම අංශය මඟින් අවධාරණය කෙරේ. ආර්ථික වර්ධන වේගය, මානව සංවර්ධන දත්ත, සමාජ දත්ත හා ඒවායේ කාලීන වෙනස්කම් විශ්ලේෂණය කිරිමේදී පළාත් 9 තුළ පවතින මූලික සංවර්ධන ගැටළු, විෂමතාවන් හා අභියෝගයන් පිළිබඳව අනාවරණය වේ. ඒවා අතුරින් ප්‍රාදේශීය සංවර්ධන විෂමතාවන් කෙරෙහි අවධානය යොමු කිරීම ඉතා වැදගත්වන අතර එය අදාළ ප්‍රජාවගේ ජීවන තත්ත්වය, මානව සංවර්ධන දර්ශකය, කාර්මීකරණ මට්ටම, කෘෂිකාර්මික හා යටිතල පහසුකම්

සංවර්ධන මට්ටම යන කාරණා සමඟ සමීපව බැඳී පවතී.බොහොමයක්ප්‍රාදේශීය සංවර්ධනවැඩසටහන් අදාළ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශ මගින් සිදු කරණු ලැබේ

ප්‍රාදේශීය සංවර්ධන විෂමතා අවම කිරීම පිළිබඳව නිදහසින් පසු සියළුම පාලන තන්ත්‍රයන් හී අවධානය යොමු වී ඇත.කඩිනම් මහවැලි සංවර්ධන වැඩසටහන, දිස්ත්‍රික් සංවර්ධන කමිටු පිහිටුවීම, පළාත් සභා හා පලාත් පාලන ක්‍රමය ස්ථාපිත කිරිම, ගම් උදා වැඩසටහන, ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරිම, ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන වැඩසටහන දියත් කිරිම, ගම නැගුම හා පුරනැගුම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශිය සංවර්ධන විෂමතා අවම කිරීම ඉලක්ක කරගත් වැඩසටහන් කිහිපයකී. ප්‍රාදේශීය සංවර්ධන අංශය අනෙකුත් අංශ ගණනාවක් සමඟ ඍජුව හෝ වක්‍රව සම්බන්ධ වන බැවින් එකී අංශ මඟින් ක්‍රියාත්මක කරන වැඩසටහන් ද ප්‍රාදේශීය සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම සඳහා වැදගත් වේ.

**විශේෂ කාර්යයන්**

- රේඛීයඅමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ 03ක් ඉදිරිපත් කරන ලද අතර ව්‍යාපෘති යෝජනා 14ක් ඇගයීමට ලක් කර ඇත.
- රාජ්‍ය ආයෝජන වැඩසටහන යාවත්කාලීන කිරීම.
- ජාතික අයවැය දෙපාර්තෙමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තෙමේන්තුව හා අදාළ රේඛීය අමාත්‍යාංශවෙත නිරික්ෂණ ඉදිරිපත් කරන ලදී.
- සිංහරාජ විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2018-2020 සකස් කරන ලදි.
- වයඹ සංවර්ධන සැලැස්ම සඳහා එකඟතාවය පල කිරීම.
- දක්ෂිණ සංවර්ධන සැලැස්ම සඳහා එකඟතාවය පල කිරීම.
- ලෝක බැංකු LDSP සඳහා උපදේශනය.

**සමාජ ආරක්ෂණ අංශය**

**සමාජ ආරක්ෂණ අංශයට අදාල ප්‍රගතිය**

සමස්ත සමාජ ආරක්ෂණ අංශය සඳහා පුළුල් ඒකාබද්ධ ප්‍රතිපත්තියක් සකස්කිරීම සහ කාන්තාවන්, ළමයින්, වැඩිහිටියන් සහ ආබාධිත පුද්ගලයින්ගේ ඇතුළු සමාජයේ අවශ්‍ය අංශයන්ගේ ජීවන තත්ව නගාසිටුවමින් රටේ සංවර්ධනයට ඔවුන් දායක කරවීම සඳහා සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට රජය සිය සමස්ත ප්‍රයත්නය දරයි.; ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය සහ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය වැනි රේඛීය අමාත්‍යාංශ, ළමුන් , වරප්‍රසාද නොලත් කාන්තාවන් , වැඩිහිටියන්සහ ආබාධිත පුද්ගලයන් ඇතුළු අවදානමට ලක්වූ කොටස්වල යහපැවැත්ම සහතිකකිරීම සඳහා වගකිවයුතු ප්‍රධාන අමාත්‍යාංශවේ.

ඉටුකරන ලද කාර්යයන්

- **ව්‍යාපෘතිවාර්තා සඳහා ඇගයීම් වාර්තා සහ කැබිනට් පත්‍රිකා සඳහා නිරීක්ෂණ සකස් කිරීම -** ව්‍යාපෘතිවාර්තා 70 ක් සඳහා ඇගයීම් වාර්තා සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සහ අදාල අමාත්‍යාංශවලට යොමු කිරීම. අදාල අමාත්‍යාංශවලින් යොමුකරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 18 ක් සඳහා නිරීක්ෂණසැපයීම.
- **ප්‍රතිපත්ති සකස් කිරීම සහ සමාලෝචනය-** පහත සඳහන් ප්‍රතිපත්ති **සමාලෝචනය** කර නිරීක්ෂණ ලබාදී ඇත;

- ශ්‍රී ලංකා පවුල් ප්‍රතිපත්තිය
- මුල් ළමාවිය සංවර්ධන ප්‍රතිපත්තිය
- දිවාසුරැකුම් ප්‍රතිපත්තිය

- ජාතික ස්ත්‍රී-පුරුෂ භාවය මත පදනම්වූ ප්‍රචණ්ඩත්වය (**GBV**) පැතිරයාමේ ජාතික සමීක්ෂණය **-** **"**කාන්තා සුබසාධන සමීක්ෂණය -2018" යන නමින් ලිංගිකත්වය පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳව සමීක්ෂණ කිරීම සඳහා UNFPA විසින්සැලසුම් කරතිබූ අතර එම සමීක්ෂණය සඳහා දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ ලබාදෙන ලදී.

- **වැඩිහිටි රැකවරණ වෙබ් අඩවිය පිහිටුවීම සඳහා සහය වීම - වැඩිහිටි රැකවරණ වෙබ් අඩවිය** නිර්මාණය කිරීමේ කාර්යයන් සඳහා දෙපාර්තමේන්තුව දායකත්වය සපයන ලද අතර කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අංශයට අනුයුක්ත බාහිර විශේෂඥයින් යොදවා ගැනීම සහ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරීන්ට අවශ්‍ය පුහුණුව ලබාදීම යන කාර්යයන් සඳහා සංකල්ප පත්‍රයක් පිළියෙළ කරන ලදී.

- **වැඩිහිටි රැකවරණ** වෙබ් අඩවිය සංවර්ධනය සඳහා සහාය වීම-වෙබ්අඩවිය නිර්මාණය කිරීමසඳහා විශේෂයෙන් තාක්ෂණික සහාය සැපයීමෙන් **වැඩිහිටි රැකවරණ** වෙබ්අඩවිය ස්ථාපනය කිරීමේ කටයුතුවලදී දෙපාර්තමේන්තුව සහායවිය

- **ශ්‍රී** ලංකා මුල් ළමාවිය සංවර්ධන සමුළුව සඳහා තාක්ෂණික වැඩමුළුවක් පැවැත්වීම **-ශ්‍රී** ලංකා රජය මඟින් 2019ජාතික අයවැය හරහා පූර්ව ළමාවිය සංවර්ධනය (ECD)සඳහාප්‍රමුඛත්වය ලබා ගැනීමට, රාජ්‍ය හා රාජ්‍ය නොවන හවුල්කරුවන් ඒකාබද්ධ කිරීමට තාක්ෂණික වැඩමුළුවක් ජාතික ක්‍රමසම්පාදන සම්පාදන දෙපාර්තමේන්තුව සමග එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) එක්වසංවිධානය කරන ලදී.

- ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය සංවර්ධන සඳහා **“Building Brains, Building Futures The Sri Lanka Early Childhood Development”** ඉහළ මට්ටමේ රැස්වීම පැවැත්වීම-ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව,එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලෙහි (UNICEF) අනුග්‍රහය ඇතිව කුඩාදරුවන්ගේ සෞඛ්‍ය, අධ්‍යාපන සහ ආරක්ෂාව යන අවශ්‍යතා කෙරෙහි අවධානය යොමුකරමින් 2019 වසර සඳහා වන ජාතික අයවැය තුළ රජය විසින් කළ හැකි ආයෝජන ප්‍රමුඛතාවයන් හඳුනාගෙන ඇත. මුදල්අමාත්‍යවරයාගේ සලකාබැලීම සඳහා මෙම ප්‍රමුඛතාවන් ඉහළ මට්ටමේ රැස්වීමේදී ඉදිරිපත් කරනලදී.

- විශේෂ **ව්‍යාපෘති**වල වර්තමාන තත්ත්වය පිළිබඳව වාර්තාව සකස් කිරීම -විවිධ අමාත්‍යාංශ මගින් විවිධ දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරනු ලබන විශේෂ ව්‍යාපෘති පිළිබඳව අදාළ තොරතුරු ඇතුළත් වාර්තාව සකස්කර, ගරුඅගමැතිතුමා වෙත ඉදිරිපත්කිරීම.

- ජාතික සමාජ ආරක්ෂණ උපාය මාර්ගය සකස්කිරීම සඳහා උපදේශක සමාගමක් බඳවාගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකරන ලද අතරඋපදේශක සමාගමට කොන්ත්‍රාත්තුව පිරිනැමීය -ජාතික සමාජ ආරක්ෂණ උපාය මාර්ග සංවර්ධනය කිරීම සඳහා අධ්‍යයන කටයුතු සිදුකරන වගකිව යුතු ආයතනය ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වේ. සමාජ ආරක්ෂණ උපාය මාර්ග සකස් කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබාගැනීම සඳහා සමාජ ආරක්ෂණ ජාලව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සමඟ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරන ලදී.

- ශ්‍රී ලංකාවේ ළමා ආරක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීමේ කමිටුවේ නිර්දේශ මත කාරක සභා වාර්තාව සකස් කිරීම -ළමුන් සඳහා දිවා සුරැකුම් පහසුකම් පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම යන මැයෙන් ඉදිරිපත් කරන ලද 2012.10.25 දිනැති අංක 17/2289/706/112 දරණ කැබිනට් මණ්ඩල තීරණය මඟින්, ශ්‍රී ලංකාවේ ළමා සුරැකුම් පහසුකම් පුළුල් කිරීම සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම සහ අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස අදාල අමාත්‍යාංශසහ ආයතනවල සාමාජිකයන්ගෙන් යුතු කමිටුවක්පත්කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට නියම කරන ලදී.ඒ අනුව ඉහත වාර්තාව සකස් කර අමාත්‍ය මණ්ඩලයේ සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන ලදී.

- **රැස්වීම් සහ වැඩමුළු සඳහා දෙපාර්තමේන්තුව නියෝජනය කිරීම-** අදාළ අමාත්‍යාංශ මගින් සංවිධානය කරන ලද මෙහෙයුම් කමිටු, ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ වැඩමුළු සඳහා සහභාගී වීම සහ සමාජ ආරක්ෂණ අංශයේ උන්නතිය සඳහා අවශ්‍ය යෙදවුම් ලබාදීම.

### 3.9 රාජ්‍ය කළමනාකරණය හා පාලන

රට තුළ වඩාත් ඉහළ මට්ටමේ යහපාලනයක් ස්ථාපිත කිරීම පිණිස රටේ තිරසර සංවර්ධනය සඳහා කැප වන අතරතුර, මහජන සහභාගිත්වය සහිතව තහවුරු කරන ලද නීතියේ ආධිපත්‍යය, දූෂණය පිටු දැකීම හා ප්‍රජාතන්ත්‍රවාදී නිදහසඉලක්ක කරගත්, ඒකාබද්ධ තාක්ෂණය, නව්‍යකරණය හා යහපාලනය යනලක්ෂණයන් පදනම් කරගත් මහජන හිතෛෂී රාජ්‍ය සේවයක් සැපයීම උදෙසා රජය ප්‍රයත්න දරනු ලබයි.

කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවාවක් සැපයීම සඳහා රාජ්‍ය සේවය තුළ ආයතනික, මානව සහ සේවා සැපයීමේ ඵලදායිතාවය යන අංශයන්හි ක්‍රමික වර්ධනයක් පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය වේ. පෞද්ගලික අංශය සංවර්ධන කාර්යයේ යෙදවීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම අරමුණු කරගෙන රාජ්‍ය අංශය කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කරනු ලබයි. එබැවින්, ඵලදායී හා කාර්යක්ෂම රාජ්‍ය සේවයක් සඳහා රාජ්‍ය අංශයේ මානව හා ප්‍රාග්ධන යන අංශ දෙකෙහිම ධාරිතා වර්ධනය ඉතා වැදගත් වේ.

මෙම දෙපාර්තමේන්තුවේ රාජ්‍ය කළමනාකරණ හා පාලන අංශය ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර පහක් ආවරණය කරනු ලබයි. එනම්, ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, පාර්ලිමේන්තුව හා ස්වාධීන කොමිෂන් සභා වැනි විශේෂ වියදම් ඒකක ද ඇතුළත් වන පරිදි රාජ්‍ය කළමනාකරණය, නීතිය හා සාමය, අධිකරණ, විදේශ කටයුතු හා ජාතික ඒකාබද්ධතා යන අංශ වේ. 2018 වර්ෂය තුළ මෙම අංශයේ වර්ධනය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව පහත පරිදි දායක වී තිබේ.

- ව්‍යාපෘති යෝජනා 83 ක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇති අතර, නිර්දේශ කිරීමේ ලිපි ජාතික අයවැය දෙපාර්තමේන්තුවට හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට යොමු කර ඇත.
- රාජ්‍ය කළමනාකරණ හා පාලන අංශයට අදාල විවිධ අමාත්‍යාංශවලින් ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 11 ක් සඳහා නිරීක්ෂණ ලබාදෙන ලදී.
- රේඛීය ආයතන විසින් මෙහෙයවන ලද මෙහෙයුම් කමිටු රැස්වීම් සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගි වීම සහ එම අංශවල ප්‍රගතිය සඳහා අවශ්‍ය දායකත්වය ලබාදීම.
- ප්‍රතිපත්ති සහ උපායමාර්ග සැකසීම සඳහා අදාල අමාත්‍යාංශ වෙත සහාය ලබාදීම.
- රාජ්‍ය අංශ කාර්යක්ෂමතා ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් හඳුනාගැනීම සඳහා අදාල ආයතන සමග රැස්වීම් කිහිපයක් සංවිධානය කිරීම.
- රාජ්‍ය ආයෝජන වැඩසටහන (2018-2021) සඳහා අංශයට අදාලව යහපාලන පරිච්ඡේද සටහන හා ආයෝජන වගු සකස් කිරීම.

**3.10 විමධ්‍යගත අයවැය වැඩසටහන**

ජාතික ලැයිස්තු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විමධ්‍යගත අයවැය ප්‍රතිපාදන කළමනාකරණය කිරීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මඟින් තාක්ෂණික සහාය ලබා දෙයි. මෙම වැඩසටහන යටතේ 2018 වර්ෂය සඳහා රුපියල් මිලියන 290 ක ප්‍රතිපාදන වෙන් කර ඇත. ( එක් මන්ත්‍රීවරයෙක් සඳහා රුපියල් මිලියන 10 බැගින් ) 2018 වර්ෂය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් රුපියල් 278,770,881ක වටිනාකමින් යුත් ව්‍යාපෘති 1806 ක් අනුමැතිය සඳහා නිර්දේශ ලබා දී ඇත.

**4. සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය**

සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය ආර්ථික සංවර්ධන, සැළසුම්කරණය හා ඒ ආශ්‍රිත විෂයන්ට අදාලව පොත්පත් හා තොරතුරු සැපයීමේ විශේෂ පුස්තකාලයක් ලෙස ක්‍රියා කරයි. මුදල් හා ජනමාධ්‍යය අමාත්‍යාංශය සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන වෘත්තිය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ පවත්නා දෙපාර්තමේන්තු වල නිලධාරීන්ගේ තොරතුරු අවශ්‍යතා සපුරාලන පුස්තකාලයක් ලෙස සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය හඳුන්වාදිය හැක. එසේම, තොරතුරු සොයා පැමිණෙන විශ්වවිද්‍යාල සිසුන්ට හා පර්යේෂකයින්ට මෙම ආයතනයේ සේවාව ලබාගත හැක.

**පුස්තකාල සංවිධානය**

- පිටතින් ලැබෙන සියලුම පොත්පත්, ලිපිලේඛන පුස්තකාලයට අත්කර ගැනීම සහ පරිශීලනයට පහසුවන ලෙස වර්ග කිරීම.
- සඟරා අංශය වැඩිදියුණු කිරීම.
- පුස්තකාලය භාවිතා කරන අයගේ පහසුව සඳහා ග්‍රන්ථ හා ලිපිලේඛන ක්‍රමවත්ව සැකසීම.

**බොදාහැරීම්, විමසීම් සහ විමර්ශන සේවා**

- තොරතුරු අවශ්‍යතා විමසීම් ගැන කටයුතු කිරීම.
- පරිගණක දත්ත උපයෝගී කරගෙන තොරතුරුගවේශණ සැකසීම.
- තොරතුරු ප්‍රවර්ධන සඳහා පරිගණක භාවිතා කොට බෙදා හැරීමට කටයුතු කිරීම.
- පුස්තකාලය භාවිතා කරන අයගේ අවශ්‍යතාඅනුව පුවත්පත් ලිපි සඟරාසුපරීක්ෂණය කිරීම.

**අනෙකුත් සේවාවන්**

- සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානයේසංඛ්‍යාංකකරණය කරන ලද එකතුව මඟින් සේවා සැපයීම සඳහා එම සේවාවෙහි තිරසාරත්වය පවත්වාගෙන යාම උදෙසා ජාතික ක්‍රමසම්පාදන

දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සහ සංජය පුද්ගලික සමාගමෙහි ප්‍රධාන විධායක නිලධාරි සමඟ 2018 හි දෙසැම්බර් මස දාහතර දින ගිවිසුමක් සඳහා අත්සන් තබන ලදි.

- වාර සඟරා ඒකාබද්ධ සූචිය පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම.
- සම්මත ක්‍රියාපටිපාටීන් අනුගමනය කරමින් ජාතික පුස්තකාලය සහ ජාතික විද්‍යා පදනම විසින්සංවිධානය කරන ලද පුස්තකාල ජාලයන්හි විවිධ කාර්යයන්ට දායකවීම.
- අන්තර් පුස්තකාල හුවමාරු ක්‍රමය පවත්වාගෙන යාම.

**5. මානව සම්පත් සංවර්ධනය සහ සාමාන්‍ය පරිපාලනය**

2018.12.31දිනට කාර්ය මණ්ඩලය

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 1. | එස්.එස්.මුදලිගේ මයා | අධ්‍යක්ෂ ජනරාල් |
| 2. | කේ.ඩී.එස්.ආර්.පෙරේරා මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 3. | සී.එස්.පෙරේරා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 4. | ජේ.එස්.එස්.රූපසිංහ මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 5. | එම්.ගංගාදරන් මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 6. | ජේ.එම්.එස් .ඩී .රත්නායක මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 7. | එන්.විජේවීර මිය | අධ්‍යක්ෂ (මුදල්) |
| 8. | ඩබ්.ඒ.එම්.මල්කාන්ති මිය | අධ්‍යක්ෂ |
| 9. | සී.සේනානායක මිය | අධ්‍යක්ෂ |
| 10. | යූ.එන්.මල්ලවාරච්චි මයා | අධ්‍යක්ෂ |
| 11. | ටී.ඒ.ඩී.ඩී.ප්‍රේමරත්න මයා | අධ්‍යක්ෂ |
| 12. | ටී.එම්.ජේ.බණ්ඩාර මයා | අධ්‍යක්ෂ |
| 13. | එම්.එෆ්.ඒ.මුබාරක් මයා | අධ්‍යක්ෂ |
| 14. | ඒ.ආර්.වික්‍රමරත්න මයා | අධ්‍යක්ෂ |
| 15. | ඒ.කේ. ගුණසේකර මිය | අධ්‍යක්ෂ |
| 16. | පී.එච්.චන්දිමා මිය | අධ්‍යක්ෂ |
| 17. | ඩී.ඒ.නිහරේපොල මිය | සහකාර අධ්‍යක්ෂ |
| 18. | පී.එම්.එස්.ජයතිලක මයා | සහකාර අධ්‍යක්ෂ |
| 19. | කේ.එන්.පී.ජයරත්න මයා | සහකාර අධ්‍යක්ෂ |
| 20. | ටී.එම්.ඩී.පී.තෙන්නකෝන් මයා | සහකාර අධ්‍යක්ෂ |

| | | |
|---|---|---|
| 21. | ඩබ්.එල්.පී .ප්‍රනාන්දු මිය | සහකාර අධ්‍යක්ෂ |
| 22. | ආර්.කේ.එල් ජාගොඩ මිය | සහකාර අධ්‍යක්ෂ |
| 23. | ටී.වයි.එල්.මුණසිංහ මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 24. | ආර්.ඩී.ඒ.මෛත්‍රීරත්න මයා | සහකාර අධ්‍යක්ෂ |
| 25. | එම්.ඒ.ජී.තුෂාරි මිය | සහකාර අධ්‍යක්ෂ |
| 26. | ඩී.ඒ.සී.ඩී.පීරිස් මිය | සහකාර අධ්‍යක්ෂ |
| 27. | ඩබ්.ඒ.ජේ.සී.වික්‍රමාරච්චි මිය | සහකාර අධ්‍යක්ෂ |
| 28. | ඒ.ලක්ෂ්මන් මිය | සහකාර අධ්‍යක්ෂ |
| 29. | ඩී.ඒ.මනෝරත්න මිය | සහකාර අධ්‍යක්ෂ |
| 30. | ඩබ්.ඒ.වල්පිට මිය | සහකාර අධ්‍යක්ෂ |
| 31. | ඩී.එච්.ආර්.ඩී.විජේවර්ධන මිය | සහකාර අධ්‍යක්ෂ |
| 32. | කේ.ජී.ආර්.ජී.ආර්.වික්‍රමවර්ධන මයා | සහකාර අධ්‍යක්ෂ |
| 33. | අයි.ටී.එන්.මෙන්ඩිස් මිය | සහකාර අධ්‍යක්ෂ |
| 34. | එච්.ඩී.එන්.කේ. හෙට්ටිආරච්චි මිය | සහකාර අධ්‍යක්ෂ |
| 35. | කේ. ඒ.එච්.කේ පෙරේරා මිය | සහකාර අධ්‍යක්ෂ |
| 36. | එස්.එම්.ඩී.ඩී.සමරකෝන් මිය | සහකාර අධ්‍යක්ෂ |
| 37. | ඩබ්.එම්.හංසනී මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 38. | කේ.බි.එස්.එස් ප්‍රනාන්දු | සහකාර අධ්‍යක්ෂ |
| 39. | කේ. ඒ.එම්.පි චන්ද්‍රපාල | සහකාර අධ්‍යක්ෂ |
| 40. | එම්.ජී.පී.කේ.ටී.ගුණවර්ධන මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 41. | කේ.ඩී.සී.තාමරසී මිය | සහකාර අධ්‍යක්ෂ |
| 42. | ජී.ආර්.එස්.එස්.තිලකරත්න මිය | සහකාර අධ්‍යක්ෂ |
| 43. | යූ.ඒ.ඩබ්.එල්.සුමනසේකර මිය | සහකාර අධ්‍යක්ෂ |
| 44. | පී.ඒ.එන්.අබේසේකර මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 45. | එම්.ඒ.එස්.දබරේරා මිය | සහකාර අධ්‍යක්ෂ |
| 46. | ඒ.පී.එස්.දිලූෂා මිය | සහකාර අධ්‍යක්ෂ |
| 47. | ඒ.වයි.එච්.අනුරුද්ධ මිය | සහකාර අධ්‍යක්ෂ |
| 48. | ජේ.එම්.ඒ.කේ.ජයසේකර මිය | සංවර්ධන නිලධාරි |
| 49. | ජී.රත්නාවලී මිය | සංවර්ධන නිලධාරි |
| 50. | එස්.බී.සමරසේකර මිය | සංවර්ධන නිලධාරි |
| 51. | කේ.ජී.පී.දමයන්ති මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 1 |
| 52. | ජේ.ඒ.ඩී.සීඑස්..ජයකොඩි මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 1 |
| 53. | ඒ.ඩී.එන්.ප්‍රියදර්ශනී මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 1 |
| 54. | වයි.ජී.එස් ප්‍රියදර්ශනි | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |

| | | |
|---|---|---|
| **55.** | ඒ.ඩී.එන්. මෙලානි මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| **56.** | එන්.ඊ. ලියනගේ මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| **57.** | පී.ඩබ්.එන්.එස්. පතිරාජ මයා | රාජ්‍ය කළමනාකරන සහකාර 111 |
| **58.** | ඊ.ඒ.එස්.එදිරිසිංහ මයා | රාජ්‍ය කළමනාකරන සහකාර 111 |
| **59.** | ජේ.ඒ.එස්.දිල්ශානි මෙය | රාජ්‍ය කළමනාකරන සහකාර 111 |
| **60.** | ඩී.ඩී.සී.උදාර මයා | රාජ්‍ය කළමනාකරන සහකාර 111 |
| **61.** | කේ.වී.ඩී.ඒ.පී.කරවිට මයා | රියදුරු 1 |
| **62.** | ඒ.එම්. ලලිත් දීපාල් මයා | රියදුරු 1 |
| **63.** | ආර්.ඒ.ආනන්ද පෙරේරා මයා | රියදුරු 1 |
| **64.** | පී.එස්.ආනන්ද මයා | රියදුරු 1 |
| **65.** | එස්.ජයසූරියර් මයා | රියදුරු 11 |
| **66.** | සුනිල් ලියනආරච්චි මයා | රියදුරු 11 |
| **67.** | ජේ.ජී.යු. විමලසිරි මයා | රියදුරු 11 |
| **68.** | ඩී.බී.දිසානායක මයා | රියදුරු 11 |
| **69.** | ඊ.ඒ.එස්.එස්. එදිරිසිංහ මයා | රියදුරු 11 |
| **70.** | යූ.කේ.ඩී.නජිත් ජීවන්ත මයා | රියදුරු 11 |
| **71.** | ඩී.ජී.බැසිල් සමන්ත මයා | රියදුරු 11 I |
| **72.** | ඩබ්.ඒ.වීරසිංහ මයා | රියදුරු 11 I |
| **73.** | එච්.ඒ.එල්.එන්.හෙට්ටිආරච්චි මයා | රියදුරු 11 I |
| **74.** | එච්.බී.ඩී.ඒ.බටගොඩ මයා | රියදුරු 11 I |
| **75.** | පී.ධර්මසිරි මයා | කා.සේ.සේවිශේෂ ශ්‍රේණිය |
| **76.** | නිමල් රංජිත් හෙට්ටි ආරච්චි මයා | කා.සේ.සේ විශේෂ ශ්‍රේණිය |
| **77.** | යූ.උපුල් රත්නකුමාර මයා | කා.සේ.සේ විශේෂ ශ්‍රේණිය |
| **78.** | ඩබ්.එන්.බොතේජු මහතා | කා.සේ.සේ.1 |
| **79.** | එම්.ඒ.එල්.නලීන් මයා | කා.සේ.සේ. 1 |
| **80.** | පි.එස්. අජිත් මයා | කා.සේ.සේ. 1 |
| **81.** | එම්.පී.ආර්.රත්නායක මයා | කා.සේ.සේ. 1 |
| **82.** | එම්.චන්දන ප්‍රදීප් මයා | කා.සේ.සේ. 11 |
| **83.** | ජේ.ඒ.එම්.ධනුෂ්ක නයන ශ්‍රී ගුණපාල මයා | කා.සේ.සේ. 111 |
| **84.** | එම්.හරිත ප්‍රභාෂ් පෙරේරා මයා | කා.සේ.සේ. 111 |
| **85.** | එස්.ඒ.ඩී.චතුරිකා සෙව්වන්දි මෙය | කා.සේ.සේ. 111 |

2018 වර්ෂයේ ස්ථාන මාරු වී ගිය නිලධාරීන්

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1. | පී.එම්.එම්.ගුණරත්න මයා | අධ්‍යක්ෂ |
| 2. | ටී.ප්‍රශාන්ත් මිය | අධ්‍යක්ෂ |
| 3. | කේ.එල්.ඩබ්.සී.එල්.ද සිල්වා මෙය | කළමනාකරණ සහකාර 1 |
| 4. | පී.එස්.ආර්.පීරිස් මයා | කළමනාකරණ සහකාර 11 |
| 5. | එච්.පී.ආර්.සමරසිංහ මයා | රියදුරු 1 |
| 6. | ඩබ්.එම්.එන්.කරුණාතිලක මයා | රියදුරු 11 |
| 7. | එම්.එල්.ඒ.සමන් නලීන් මයා | කා.සේ.සේ.1 |
| 8. | එන්.එස්.යූ.කේ.සිල්වා මයා | කා.සේ.සේ.1 |

2018 වර්ෂයේ ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 1. | ජේ.එස්.එස්.රූපසිංහ මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 2. | ඩබ්.ඒ.එම්.මල්කාන්ති මිය | අධ්‍යක්ෂ |
| 3. | ඒ.පී.එස්.දිලූෂා මිය | සහකාර අධ්‍යක්ෂ |
| 4. | ඒ.වයි.එච්.අනුරුද්ධ මිය | සහකාර අධ්‍යක්ෂ |
| 5. | එම්.එල්.ඒ.සමන් නලීන් මයා | කා.සේ.සේ.1 |
| 6. | ආර්.ඒ.ආනන්ද පෙරේරා මයා | රියදුරු 1 |
| 7. | යූ.කේ.ඩී.නජිත් ජීවන්ත මයා | රියදුරු11 |
| 8. | ඩබ්.ඒ.සී.වීරසිංහ මයා | රියදුර 111 |
| 9. | එච්.ඒ.එල්.එන්.හෙට්ටිආරච්චි මයා | රියදුරු 111 |
| 10. | එච්.බී.ඩී.ඒ.බටගොඩ මයා | රියදුරු 111 |

2018 වර්ෂයේ නව පත්වීම්

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| **1.** | ජේ.ඒ.එස්.දිල්ශානි මෙය | කළමනාකරණ සහකාර 111 |
| **2.** | ඩී.ඩී.සී.උදාර මයා | කළමනාකරණ සහකාර 111 |
| **3.** | ජේ.ඒ.එම්.ධනුෂ්ක නයන ශ්‍රී ගුණපාල මයා | කා.සේ.සේ. 111 |
| **4.** | එම්.හරිත ප්‍රභාෂ් පෙරේරා මයා | කා.සේ.සේ. 111 |
| **5.** | එස්.ඒ.ඩී.චතුරිකා සෙව්වන්දි මෙය | කා.සේ.සේ. 111 |

2018 වර්ෂයේ විශ්‍රාම ගිය නිලධාරීන්

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | එම්.ඩී.චන්ද්‍රා මිය | කළමනාකරණ සහකාර 1 |

**විදේශ පුහුණු 2018**

| අංකය | නම | වැඩසටහන | රට | කාලය |
|---|---|---|---|---|
| 01 | එස්.එස්. මුදලිගේ මහතා<br>අධ්‍යක්ෂ ජනරාල් | SASEC Nodal Officials and Working Grouf Meeting වැඩසටහන<br><br>Annual Country Consultation with Asian Development Bank Visit සඳහා සහභාගි වූ ශ්‍රී ලංකා නියෝජිත කන්ඩායමේ සමාජික<br><br>$51^{st}$ ADB Annual Meeting වැඩසටහන<br><br>Ministerial Seminar on financial strategy for Development Countries 2018 වැඩසටහන | සිංගප්පූරුව<br><br>පිලිපීනය<br><br>පිලිපීනය<br><br>චීනය | 2018 මාර්තු මස 05-06 දක්වා .<br><br>2018 මාර්තු 22-23 දක්වා<br><br>2018 මැයි මස 3-6 දක්වා<br><br>2018 ජුනි 11-17 දක්වා |

| | | | | |
|---|---|---|---|---|
| | | Engaging Civil Society Organizations in the SustainableDevelopment Goals වැඩසටහන | ජපානය | 2018 සැප්තැම්බර් මස 24-29 දක්වා |
| 02 | එම්.ගංගාදරන් මිය<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | UNESCAP Gender Policy - Data Initiative: Inception වැඩමුළුව<br><br>"Consultation with Senior Government Officials on ADB's Strategy 2030-Aligned Corporate Results Framework"වැඩසටහන | තායිලන්තය<br><br>තායිලන්තය | 2018 අප්‍රේල් 21-23<br><br>2018 සැප්තැම්බර් මස 28 |
| 03 | ජේ.එම්.එස්.ඩී.රත්නායක මිය | Inter - Agency Social Protection Assessment (ISPA) Tools පුහුණු වැඩසටහන<br><br>CPT Good Agricultural Practieeces (GAP) Strategies for Sri Lanka වැඩසටහන<br><br>Developing Effective Responses and Long -Term Care Systems වැඩසටහන | ඉන්දුනිසියාව<br><br>තායිලන්තය<br><br>ජපානය | 2018 මාර්තු 12-16 දක්වා<br><br>2018 මැයි 20 සිට 26 දක්වා<br><br>December 2018 දෙසැම්බර් මස 05-07 දක්වා |
| 04 | කේ.ඩී.එස්.ආර්.පෙරේරා මහතා<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | SAARC Development Fund's (SDF) Partnership Conclave 2018 "Regional Integration Through Project Collaboration and Investments වැඩසටහන | ඉන්දියාව | 2018 ජුලි 1-5 දක්වා |

| | | | | |
|---|---|---|---|---|
| 05 | ජේ.එස්.එස්.රූපසිංහ මිය<br>අති.අධ්‍ය. ජනරාල් | 2018 Seminar on " China's experience- China's Social System and Public Policy" වැඩසටහන | චීනය | 2018ජුලි 02-17 දක්වා |
| 06 | සී.එස්. පෙරේරා මිය<br>අති. අධ්‍යක්ෂ ජනරාල් | Official Delegation to South Africa to discuss on Appraisal and Evaluation System වැඩසටහන | දකුණු අප්‍රිකාව | 23-25 ජුලි 2018 |
| 07 | ඒ.ආර්. වික්‍රමරත්න මහතා<br>අධ්‍යක්ෂ | SASEC Sub regional Workshop on Sanitary-Phytosanitary and Technical Barriers to Trade National and Regional Diagnostic Studies, වැඩසටහන<br><br>CPT Good Agricultural Practieeces (GAP) Strategies for Sri Lanka වැඩසටහන | ඉන්දියාව<br><br>තායිලන්තය | 2018 අප්‍රේල් 11-13 දක්වා<br><br>2018 මැයි 20 සිට 26 දක්වා |
| 08 | ටී.ඒ.ඩී.ඩී. ප්‍රේමරත්න මහතා අධ්‍යක්ෂ | 5th Asia Pacific Forum on Sustainable Development: Transformation towards Sustainable Development and resilient societies වැඩසටහන | තායිලන්තය | 2018 මාර්තු 28-30 දක්වා |
| 09 | එම්.එෆ් ඒ මුබාරක් මහතා<br>අධ්‍යක්ෂ | City Resilience Programme වැඩසටහන<br><br>Smart City Forum World Congress / City Solution සමුළුව | තායිලන්තය<br><br>ස්පාඤ්ඤය | 2018 ජුලි 08-14 දක්වා<br><br>2018 නොවැම්බර් මස 13 සිට 15 දක්වා. |
| 10 | ටී.එම්.ජේ. බණ්ඩාර | 74th Session of the Economic | තායිලන්තය | 11-16 May |

| | | | | |
|---|---|---|---|---|
| | මහතා<br>අධ්‍යක්ෂ | and Social Commission for Asia and the Pacific (ESCAP)<br>Asia Pacific Regional Early Childhood Development Conference<br><br>Social Protection Study Visit, | <br><br>නේපාලය<br><br>පිලිපීනය | 2018<br><br>5-7 June 2018<br><br>28-31 August 2018 |
| 11 | ඒ.කේ.ගුණසේකර මිය<br>අධ්‍යක්ෂ | Asian Development Bank's Inter-Sub regional Knowledge-Sharing Forum on Enhanced Implementation of the World Trade Organization Trade Facilitation Agreement වැඩසටහන | තායිලන්තය | 2018 ඔක්තෝම්බර් 30-31 |
| 12 | සී.සේනානායක මිය<br>අධ්‍යක්ෂ | Bi-regional වැඩමුළුව | වියට්නාමය | 2018ජුනි 24-29 දක්වා |
| 13 | එන්.විජේවීර මිය<br>අධ්‍යක්ෂ | Conducting Standardizing Oversight Over Workplace Safety වැඩසටහන | චීනය | 2018 ඔක්තෝම්බර් 10-23 දක්වා |
| 14 | එස්.එම්.ඩී.ඩී.සමරකෝන් මිය<br>සහකාර අධ්‍යක්ෂ | Seminar on Economic Policies & Economic Affairs | ජපානය | මැයි14- ජුනි 18 |
| 15 | පී.එම්.එස්.ජයතිලක මහතා<br>හකාර අධ්‍යක්ෂ | Climate Resilience Improvement Project (CRIP) | මෙක්සිකෝව | මැයි14- මැයි 18 |
| 16 | නුවන්ගි හෙට්ටිආරච්චි මිය<br>සහකාර අධ්‍යක්ෂ | JICA Knowledge Co-Creation Program - Strengthening Social Health Protection Towards | ජපානය | ජනවාරි මස 15 සිට 26 දක්වා |

| | | | | |
|---|---|---|---|---|
| | | Universal health Coverage වැඩ සටහන<br><br>Overweight and Obesity in Asia and the Pacific වැඩසටහන | පිලිපීනය | ජුලි මස 13 සිට 18 දක්වා |
| 17 | එච්.ජී.වී.කේ.ටී. ගුණවර්ධන මිය<br>සහකාර අධ්‍යක්ෂ | CPT Good Agricultural Practieeces (GAP) Strategies for Sri Lanka වැඩසටහන | තායිලන්තය | මැයි 20-26 දක්වා |
| 18 | අහල්‍යා ලක්ෂ්මන් මිය<br>සහකාර අධ්‍යක්ෂ | on Financial Programming and Policies පුහුණු වැඩසටහන | ඉන්දියාව | අප්‍රේල් 16-27 දක්වා |
| 19 | කේ.ඒ.එච්.කේ පෙරේරා මිය<br>සහකාර අධ්‍යක්ෂ | Smart Nation: Strategy to Implementation වැඩමුළුව | සිංගප්පූරුව | නොවැම්බර් 26-30 දක්වා |
| 20 | ආර්.ඩී.ඒ.මෛත්‍රිරත්න මයා<br>සහකාර අධ්‍යක්ෂ | 1st University - Industry Linkages Visit ADB and Peking University Knowledge Partnership Event පුහුණු වැඩසටහන | චීනය | දෙසැම්බර් මස 02-07 දක්වා |
| 21 | ඇන් දබරේරා මිය<br>සහකාර අධ්‍යක්ෂ | පශ්චාත් උපාධි පාඨමාලාව | ජපානය | 2018 අප්‍රේල් සිට 2020 මාර්තු දක්වා |
| 22 | ඩබ්.ඒ හංසනී මිය<br>සහකාර අධ්‍යක්ෂ | Comprehensive Urban Transportation Planning පුහුණු වැඩ සටහන | ජපානය | 2018 නොවැම්බර් මස 12 සිට දෙසැම්බර් මස 15 දක්වා |
| 23 | ඩී.ඒ මනෝරත්න මහත්මිය<br>සහකාර අධ්‍යක්ෂ | 5th Regional Training Course on the National Strategy for the Development of Statistics (NSDS) and Advanced Data Planning Tool (ADAPT) වැඩසටහන | ජපානය | 2018 නොවැම්බර් 6-9 දක්වා |
| 24 | ටී.එම්.ඩී.පී.තෙන්න කෝන් මයා | South Asia Capacity Building Program on Successful project | බන්ගලාදේශය | ජුලි 31 සිට අගෝස්තු |

| | | | | |
|---|---|---|---|---|
| | සහකාර අධ්‍යක්ෂ | Design and Implementation for Executing/Implementing Agencies පුහුණු වැඩසටහන | | 31 දක්වා |
| 25 | අයි.ටී.එන්.මෙන්ඩිස් මිය<br>සහකාර අධ්‍යක්ෂ | South Asia Forum on the Sustainable Development Goals වැඩසටහන | ඉන්දියාව | ඔක්තෝම්බර් 4-5 |
| 26 | එම්.ඒ.ජී තුෂාරි මිය<br>සහකාර අධ්‍යක්ෂ | Social Protection Study Visit වැඩසටහන | පිලිපීනය | අගෝස්තු 28-31 දක්වා |
| 27 | අප්සරා වල්පිට මිය<br>සහකාර අධ්‍යක්ෂ | PHD පාඨමාලාව | ජපානය | 2018.04.01 සිට 2021.03.31 දක්වා |
| 28 | කේ.ජී.ආර්.ජී.ආර්.වික්‍රම වර්ධන මහතා<br>සහකාර අධ්‍යක්ෂ | Study for the Masters of Economic Policy අධ්‍යයන පාඨමාලාව | ඔස්ට්‍රේලියාව | 2018.01.08 - 2019.12.31 |
| 29 | පී.ඒ.එන්.අබේසේකර මිය<br>සහකාර අධ්‍යක්ෂ | Study for the Masters of Economic Policy උපාධි පාඨමාලාව | ඔස්ට්‍රේලියාව | 2018.06.12 - 2020.06.17 |

## 6. මූල්‍ය කාර්ය සාධනය -2018

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට අදාලව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට නියමිත මූල්‍ය ප්‍රකාශනවල සඳහන් පරිදි වෙන් කරන ලද ප්‍රතිපාදන සහ මුළු වියදම, පුනරාවර්තන සහ මූලධන වශයෙන් පහත පරිදි සාරාංශ කළ හැක.

| වැඩසටහනෙහි නම | උප ව්‍යාපෘතිය | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|
| | | මුළු ප්‍රතිපාදනය (රු.) | සත්‍ය වියදම (රු.) | වියදමෙහි ප්‍රතිශතය (%) | මුළු ප්‍රතිපාදනය (රු.) | සත්‍ය වියදම (රු.) | වියදමෙහි ප්‍රතිශතය (%) |
| පුනරාවර්තන | | 85,222,000 | 82,820,601 | 97.18 | 97,000,000 | 88,462,086 | 91.20 |
| මූලධන | | 10,223,000 | 6,273,910 | 61.37 | 12,000,000 | 6,523,012 | 54.36 |
| **උප එකතුව** | | **95,445,000** | **89,094,511** | **93.35** | **109,000,000** | **94,985,098** | **87.14** |
| මූලධන<br>(PPPF) විදේශ ණය (12)<br>(PPPF) දේශීය අරමුදල්(17) | 17 | - | - | - | 100,000,000<br>2,000,000 | 25,713,327<br>1,375,948 | 25.71<br>68.80 |
| **උප එකතුව** | | | | | **102,000,000** | **27,089,275** | **26.56** |
| **මුළු එකතුව** | | **95,445,000** | **89,094,511** | **93.35** | **211,000,000** | **122,074,374** | **57.86** |